සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව , 2026
கல்விப் பொது தராதர (உயர்தரப்) பரீட்சை – கற்றலுக்கான உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv. Level) Supportive Assesment , 2026

ආර්ථික විද්‍යාව I பொருளியல் I Economics I	21 S I	පැය දෙකයි இரண்டு மணித்தியாலம் Two hours

උපදෙස් :

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න .
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට **(1), (2), (3), (4), (5)** යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගෙන, එය **උත්තර පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**

---

1. සූක්ෂ්ම ආර්ථික විද්‍යාවට හා සාර්ව ආර්ථික විද්‍යාවට අයත් සිද්ධීන් පිළිවෙලින් දැක්වෙන නිවැරදි පිළිතුර කුමක්ද?


(1) ලෝක වෙළෙඳපොළෙහි බොරතෙල් මිල ඉහළ යාම සහ ශ්‍රී ලංකාවේ ඉන්ධන මිල ඉහළ යාම.
(2) උද්ධමන අනුපාතිකය ඉහළ යාම සහ විනිමය අනුපාතිකය ඉහළ යාම.
(3) දේශීය වෙළෙඳපොළෙහි තේ මිල ඉහළ යාම සහ මූර්ත ජාතික ආදායම ඉහළ යාම.
(4) ආර්ථික බිඳ වැටීම සහ දරිද්‍රතාවය ඉහළ යාම.
(5) ආර්ථික සම්පත් හිඟය උග්‍රවීම සහ නිෂ්පාදනයේ ආවස්ථික පිරිවැය ඉහළ යාම.

2. ස්වාභාවික ප්‍රාග්ධනයට අදාළ නිදසුන් පමණක් දැක්වෙන නිවැරදි පිළිතුර තෝරන්න.

(1) ගොවිපොළෙහි කිරි ගවයන් , වරාය සහ වන සතුන්
(2) නළ ජලය , සූර්ය පැනල මගින් උත්පාදිත විදුලිබලය සහ තෙත් බිම්
(3) ස්වාභාවික වනාන්තර , කුකුළු ගොවිපොළ සහ ත්‍රිකුණාමලය වරාය
(4) ඔප දැමූ මැණික් , දියමන්ති මාල සහ විසිතුරු මත්ස්‍ය වගාව
(5) ජල චක්‍රය, පරාගන ක්‍රියාවලිය සහ දේශගුණය

3. කෘෂිකාර්මික භාණ්ඩ හා කාර්මික භාණ්ඩ යන භාණ්ඩ දෙවර්ගය නිපදවමින් නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය මත C ලක්ෂ්‍යයේ කටයුතු කරන ආර්ථිකයක් උපකල්පනය කරන්න. රටේ ප්‍රාග්ධන සම්පත් සම්භාරයට විශාල හානියක් සිදු වූ දිට්වා (Ditwah) සුළි කුණාටුවෙන් පසු මෙම ආර්ථිකයේ නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය සම්බන්ධව සිදු වූ බලපෑම වන්නේ,

(1) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය ඇතුළතට විතැන් වීම කි.
(2) නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය පිටතට විතැන් වීම කි.
(3) නිෂ්පාදන ලක්ෂ්‍යය වක්‍රය දිගේ ඉහළට ගමන් කිරීම කී.
(4) නිෂ්පාදන ලක්ෂ්‍යය ඇතුළත ලක්ෂ්‍යයක් වෙත ගමන් කිරීම කි.
(5) නිෂ්පාදන ලක්ෂ්‍යය පිටත ලක්ෂ්‍යයක් වෙත ගමන් කිරීම කි.



4. සමාජීය වෙළෙඳපොළ ආර්ථිකයක් යනු,

(1) වෙළෙඳපොළ බලවේග ඔස්සේ මූලික ආර්ථික ප්‍රශ්න විසඳන ආර්ථිකය කි.
(2) රජයේ සැලසුම් ඔස්සේ මූලික ආර්ථික ප්‍රශ්න විසඳන ආර්ථිකය කි.
(3) රජය සතු නිෂ්පාදන සම්පත් භාවිතයට පෞද්ගලික අංශය මැදිහත් වන ආර්ථිකය කි.
(4) සමාජ සාධාරණත්වය දැඩි ව අවධාරණය කරන ආර්ථිකය කි.
(5) ආගමික දෘෂ්ටිවාද මත පදනම් ව මූලික ආර්ථික ප්‍රශ්න විසඳන ආර්ථිකය කි.

5. භාණ්ඩයක ඉල්ලුම් ප්‍රසාරණයක් සිදුවීමට බලපාන සාධකය වනුයේ,

(1) ආදේශක භාණ්ඩයක මිල ඉහළ යාම. (2) අනුපූරක භාණ්ඩයක මිල ඉහළ යාම.

(3) පාරිභෝගික ආදායම ඉහළ යාම. (4) අදාළ භාණ්ඩයේ මිල පහළ යාම.

(5) අනාගතයේ දී මිල අඩු වෙතැයි අපේක්ෂාව.

6. භාණ්ඩයක ඉල්ලුම් සමීකරණය, Qd = 600 - 10P වේ. මෙම භාණ්ඩයේ උපරිම අයභාරය සහ අයභාරය උපරිම වන මිල වනුයේ,

	උපරිම අයභාරය (රු.)	අයභාරය උපරිම වන මිල (රු.)
(1)	9,000	60
(2)	9,000	30
(3)	18,000	40
(4)	18,000	30
(5)	10,000	15

7. X නමැති භාණ්ඩයේ සැපයුම් සමීකරණය Qs = - 400 + 3P ලෙස පැවති අතර එය Qs = 200 + 3P ලෙස වෙනස් විය. මෙයට බලපෑ සාධකය විය හැක්කේ,

(1) එම භාණ්ඩයේ මිල වැඩි වීම ය. (2) නිෂ්පාදන පිරිවැය අඩු වීම ය.

(3) නිෂ්පාදන තාක්ෂණය පිරිහීම ය. (4) සැපයුම්කරුවන් සංඛ්‍යාව අඩු වීම ය.

(5) නිෂ්පාදයේ ආදේශක භාණ්ඩයක මිල වැඩි වීම ය.

8. භාණ්ඩයක වෙළෙඳපොළ සැපයුම් ප්‍රමාණය වැඩිවන විට , නම්‍යතා සංගුණකයේ අගය ක්‍රමයෙන් වැඩි වේ. මෙම භාණ්ඩයේ සැපයුමේ මිල නම්‍යතාව හා සැපයුම් වක්‍රයේ සිරස් අන්තඃඛණ්ඩය පිළිබඳ නිවැරදි පිළිතුර වන්නේ,

	සැපයුම් නම්‍යතාව	සිරස් අන්ත:ඛණ්ඩය
(1)	පූර්ණ අනම්‍ය	ධන වේ
(2)	පූර්ණ නම්‍ය	ශූන්‍ය වේ
(3)	ඒකීය නම්‍ය	ධන වේ
(4)	අනම්‍ය	ඍණ වේ
(5)	නම්‍ය	ධන වේ

9. තරගකාරී වෙළෙඳපොළක අලෙවි කරන භාණ්ඩයකට අදාළ වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

Qd = 160 - 4 P Qs = - 20 + 2P

වෙළෙඳපොළ සමතුලිතයේ දී මිල හා නිෂ්පාදක අතිරික්තය වනුයේ ,

	සමතුලිත මිල (රුපියල්)	නිෂ්පාදක අතිරික්තය (රුපියල්)
(1)	30	200
(2)	40	800
(3)	25	200
(4)	30	400
(5)	80	600

10. කිසියම් භාණ්ඩයක වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

Qd = 10 - P Qs = 4 + 2P

වෙළෙඳපොළ සමතුලිතයේ දී මුළු අයභාරය කොපමණ ද?

(1) රු.16 කි. (2) රු. 24 කි. (3) රු. 32 කි. (4) රු. 54 කි. (5) රු. 64 කි.

11. තරහකාරී වෙළෙඳපොළක අලෙවි වන දොඩම් සඳහා ඉල්ලුම හා සැපයුම යන දෙක ම ඉහළ ගිය හොත්,

(1) සමතුලිත මිල ඉහළ නගින අතර සමතුලිත ප්‍රමාණය ද ඉහළ යයි.


(2) සමතුලිත මිල පහළ බසින අතර සමතුලිත ප්‍රමාණය ද පහළ යයි.

(3) සමතුලිත මිල ඉහළ හෝ පහළ යන අතර සමතුලිත ප්‍රමාණය පහළ යයි.

(4) සමතුලිත මිල පහළ හෝ ඉහළ යා හැකි අතර සමතුලිත ප්‍රමාණය ඉහළ යයි.

(5) සමතුලිත මිල පහළ යාම, ඉහළ යාම හෝ ස්ථාවර වීම සිදු විය හැකි අතර සමතුලිත ප්‍රමාණය ඉහළ යයි.

12. භාණ්ඩයක වෙළෙඳපොළ ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයන් පහත ප්‍රස්තාරයෙන් දැක්වේ. මෙම භාණ්ඩය සඳහා රු.60ක උපරිම අලෙවි මිලක් රජය විසින් නියම කරන ලදි. උපරිම මිල නියම කිරීමෙන් පසු නිෂ්පාදක අතිරික්තය සහ උපරිම මිල යටතේ ඇතිවන අධි ඉල්ලුම් ප්‍රමාණය නිවැරදි ව දැක්වෙන පිළිතුර කුමක් ද?



	නිෂ්පාදක අතිරික්තය (රු.)	අධි ඉල්ලුම් ප්‍රමාණය (ඒකක)
(1)	48,000	400
(2)	36,000	200
(3)	18,000	400
(4)	8,000	200
(5)	8,000	400

13. භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් සමීකරණ අනුපිළිවෙලින් Qd =500 - 10P සහ Qs = - 100 + 10P වේ. මෙම භාණ්ඩය සඳහා රු.40 ක සහතික මිලක් නිෂ්පාදකයන් වෙත ලබා දෙන බවට රජය එකඟ වී, ඌන පූරණ ගෙවීමේ මිල ආධාරක ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරන ලදී. ඒ වෙනුවෙන් රජය දරන පිරිවැය හා අභිමිවන ශුභ සාධන පිරිවැය අනුපිළිවෙළින් නිවැරදි ව දැක්වෙන පිළිතුර වන්නේ,

(1) රු. 8000 සහ රු. 1000 වේ.
(2) රු. 8000 සහ රු. 7000 වේ.
(3) රු. 6000 සහ රු. 1000 වේ.
(4) රු. 6000 සහ රු. 7000 වේ.
(5) රු. 6000 සහ රු. 2000 වේ.

14. භාණ්ඩයක් මත බදු පැනවීමෙන් පසු ඒකක බද්දේ ප්‍රමාණයෙන් ම එම භාණ්ඩයේ මිල ඉහළ යන්නේ,

(1) නම්‍ය සැපයුමක් හා පූර්ණ අනම්‍ය ඉල්ලුමක් පවතින විට දී ය.
(2) නම්‍ය සැපයුමක් හා පූර්ණ නම්‍ය ඉල්ලුමක් පවතින විට දී ය.
(3) ඒකීය නම්‍ය සැපයුමක් හා පූර්ණ නම්‍ය ඉල්ලුමක් පවතින විට දී ය.
(4) අනම්‍ය සැපයුමක් හා අනම්‍ය ඉල්ලුමක් පවතින විට දී ය .
(5) අනම්‍ය සැපයුමක් හා නම්‍ය ඉල්ලුමක් පවතින විට දී ය.

15. කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ දී විචල්‍ය යෙදවුම සමානුපාතිකව වැඩි කරන විට මුළු නිමැවුම වෙනස් වූ ආකාරය පහත වගුවෙන් දැක්වේ.

ශ්‍රම ඒකක (L)	1	2	3	4	5
මුළු නිමැවුම ඒකක (TP)	5	13	25	34	37

ඉහත තොරතුරු වලට අනුව ආන්තික ඵලදාව හීන වීම ආරම්භ වන්නේ කවර විචල්‍ය යෙදවුමෙන් පසුව ද?

(1) 1 න් පසුව (2) 2 න් පසුව (3) 3 න් පසුව (4) 4 න් පසුව (5) 5 න් පසුව

16. ආයතනයක කෙටිකාලීන නිෂ්පාදන පිරිවැය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

නිමැවුම (ඒකක)	සාමාන්‍ය විචල්‍ය පිරිවැය (රු.)
100	10
120	12


මෙම ආයතනයේ මුළු ස්ථාවර පිරිවැය රු.1200 කි. මෙම නිමැවුම් පරාසය තුළ ආන්තික පිරිවැය වන්නේ,

(1) රු.2 කි. (2) රු.10 කි. (3) රු.12 කි. (4) රු.22 කි. (5) රු.40 කි.

17. කෙටි කාලයේ දී පූර්ණ තරගකාරී වෙළෙඳපොළක ක්‍රියාකාරී ආයතනයක් අලෙවි කරන භාණ්ඩයක මිල රු.30 ක් වන විට ලාභ උපරිම වන නිමැවුම් මට්ටම ඒකක 1000 කි. මෙම නිමැවුම් මට්ටමේ දී ආයතනය රු.5000ක ආර්ථික ලාභයක් ලබයි. ආයතනයේ සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC) රු. 5 කි. මෙම ආයතනයේ සාමාන්‍ය මුළු පිරිවැය (ATC) සහ මුළු විචල්‍ය පිරිවැය (TVC) නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

	සාමාන්‍ය මුළු පිරිවැය (ATC)	මුළු විචල්‍ය පිරිවැය (TVC)
(1)	රු.30	රු.25 000
(2)	රු.25	රු.20 000
(3)	රු.25	රු.15 000
(4)	රු.20	රු.25 000
(5)	රු.15	රු.20 000

18. පූර්ණ තරඟකාරී නිෂ්පාදන ආයතනයක ඉල්ලුම් වක්‍රය සහ ආන්තික පිරිවැය වක්‍රය පහත ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ.



මෙම ආයතනය නිමැවුම Q_0 සිට Q_1 දක්වා වැඩි කළේ නම්,

(1) ආයතනයේ ලාභ අඩු වේ.
(2) ආයතනය ප්‍රාමාණික ලාභ ලබයි.
(3) ආයතනයේ නිෂ්ප්‍රාමාණික ලාභ ද වැඩි වේ.
(4) ආයතනයේ මුළු පිරිවැය වැඩි වුව ද මුළු අයභාරය අඩුවේ.
(5) ආයතනයේ මුළු අයභාරය වැඩි වුව ද මුළු පිරිවැයේ වෙනස් වීමක් සිදු නොවේ.

19. ව්‍යාපාර චක්‍රයක ධන නිමැවුම් පරතරය වර්ධනය වන විට,

(1) විරැකියාව වැඩි වේ. (2) උද්ධමනය වැඩි වේ.
(3) සමාහාර ඉල්ලුම අඩු වේ. (4) මූර්ත දළ දේශීය නිමැවුම අඩු වේ.
(5) රජයේ බදු ආදායම අඩු වේ.

20. පහත දැක්වෙන උදාහරණ අතරින් ශ්‍රී ලංකාවේ නේවාසිකයින් **නොවන** කණ්ඩායමට අයත් වනුයේ,

(1) දිගුකාලීනව මැද පෙරදිග රටවල සේවා නියුක්ත ලාංකිකයන්.
(2) මාස තුනක් ඉන්දියානු විශ්ව විද්‍යාලවලට සේවා සැපයීමට විදේශගත වූ ලාංකිකයන්.
(3) අධ්‍යාපනය සඳහා වසර හතරකට එක්සත් රාජධානියට ගිය ලාංකිකයන්.
(4) ශ්‍රී ලංකාවේ ඇමරිකානු තානාපති කාර්යාලයේ සේවා නියුතු ලාංකිකයන්.
(5) සංදර්ශනයක් සඳහා තුන් මසකට විදේශගත වූ ලාංකීය කලාකරුවන්.

21. දළ දේශීය වියදම ඉක්ම වූ දළ දේශීය නිමැවුමක් බිහි වන්නේ,

(1) ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම ධන අගයක් ගන්නා විට ය .
(2) ශුද්ධ විදේශ ද්විතීයික ආදායම ධන අගයක් ගන්නා විට ය.
(3) ශුද්ධ අපනයන ධන අගයක් ගන්නා විට ය .
(4) ශුද්ධ අපනයන ඍණ අගයක් ගන්නා විට ය.
(5) ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම ඍණ අගයක් ගන්නා විට ය .

22. පහත දැක්වෙන උදාහරණ අතරින් ජාතික ගිණුම් සම්පාදනයේ දී දළ ජාතික ආදායමට ඇතුළත් **නොවන** සංරචකය කුමක්ද?

(1) සේවක ආදායම (2) නිෂ්පාදනය මත ශුද්ධ බදු (3) මිශ්‍ර ආදායම
(4) දළ මෙහෙයුම් අතිරික්තය (5) රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප්

23. ස්වාධීන වියදම් නොවෙනස් ව තිබිය දී, සමතුලිත ජාතික ආදායම ඉහළ යා හැක්කේ,

(1) ස්වාධීන බදු ඉහළ නැංවීමක දී ය. (2) ආන්තික පරිභෝජන නැමියාව පහළ යාමක දී ය.
(3) ආන්තික පරිභෝජන නැමියාව ඉහළ යාමක දී ය. (4) ශුද්ධ ආයෝජන ඉහළ නැංවීමක දී ය.
(5) රාජ්‍ය සංක්‍රාම කපා හැරීමක දී ය.

24. ආර්ථිකයක ස්වායත්ත වියදම් රු.මි. 100කින් ඉහළ නැංවුව හොත් මූර්ත දළ දේශීය නිෂ්පාදිතය රු.මි.500කින් ඉහළ යනු ඇතැයි ගණන් බලා ඇත. මෙම ආර්ථිකයේ ස්වාධීන බදු රු. මි. 100 කින් වැඩි කරනු ලැබුව හොත් මූර්ත දළ දේශීය නිෂ්පාදිතය,

(1) රු.මි.100 කින් අඩු වේ. (2) රු.මි.100 කින් වැඩි වේ. (3) රු.මි.500 කින් අඩු වේ.
(4) රු.මි.400 කින් අඩු වේ. (5) රු.මි.400 කින් වැඩි වේ.

25. ආර්ථික පසුබැසීම් අවධියේ පවතින ආර්ථිකයක් නැවත ගොඩ නැගීම සඳහා වඩාත් සුදුසු වන්නේ,

(1) අතිරික්ත අයවැය ලේඛනය කි. (2) හිඟ අයවැය ලේඛනය කි.
(3) තුලිත අයවැය ලේඛනය කි. (4) සංකෝචනාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය කි.
(5) තුලිත අයවැය ලේඛනයක් හෝ අතිරික්ත අයවැය ලේඛනය කි.

26. ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනයට හේතුවන සාධකයක් වනුයේ,

(1) මුදල් සැපයුම පහළ යාම.
(2) රාජ්‍ය මිලදී ගැනීම් ඉහළ දැමීම.
(3) පොලී අනුපාතය ඉහළ යාම.
(4) ආදායම් බදු ඉහළ දැමීම.
(5) නිෂ්පාදන යෙදවුම් මිල ඉහළ යාම.

27. මහ බැංකුව විසින් මූල්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීම සඳහා යොදා ගනු ලබන ප්‍රධාන උපකරණයක් **නොවන්නේ**,

(1) නිත්‍ය පහසුකම් අනුපාතික
(2) ඉදිරි මාර්ගෝපදේශ
(3) එක් දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය
(4) විවට වෙළඳපොළ කටයුතු
(5) ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය

28. කල්පිත ආර්ථිකයක මූල්‍ය තොරතුරු පහත දැක්වේ. (සියළුම සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)

මහජනයා සතු ව්‍යවහාර මුදල්	-	800
වාණිජ බැංකු සතු ව්‍යවහාර මුදල්	-	300
ව්‍යවස්ථාපිත සංචිත අනුපාතිකය	-	10%
මහජනයා සතු ඉල්ලුම් තැන්පතු	-	1000

ඉහත තොරතුරු අනුව නිවැරදි පිළිතුර වන්නේ,

	අධිබලැති මුදල් (රු.මි)	මුදල් ගුණකය (පටු මුදල් සැපයුම අනුව)
(1)	400	2.0
(2)	900	1.6
(3)	900	1.5
(4)	1100	1.0
(5)	1200	1.5

29. ආසන්න මුදල් සඳහා වඩාත් ගැළපෙන උදාහරණය වන්නේ,

(1) ජංගම ගිණුම මත ලියන ලද චෙක්පත්
(2) සමරු කාසි.
(3) ණය පත්.
(4) කල් පිරීමට ආසන්න වූ පිළිණුපත්.
(5) හරපත්.

30. වාණිජ බැංකු පද්ධතිය සතු සංචිත ප්‍රමාණය රුපියල් බිලියන 1000ක් ද, තැන්පතු ප්‍රමාණය රුපියල් බිලියන 8000ක් ද, මහජනයා සතු ව්‍යවහාර මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 2000ක් ද වේ. මෙම තත්ත්වය යටතේ මුදල් ගුණකය හා පටු මුදල් සැපයුම පිළිවෙළින්,

(1) 2.00 හා රු.බි.3000 කි.
(2) 3.00 හා රු.බි.8000 කි.
(3) 3.33 හා රු.බි.8000 කි.
(4) 3.33 හා රු.බි.10000 කි.
(5) 5.00 හා රු.බි.10000 කි.

31. ඍණ බාහිරතා පවතින භාණ්ඩයක් නිෂ්පාදනය කරන විට වෙළෙඳපොළ තුළ ,

(1) ඌන නිෂ්පාදනයක් සිදු වේ.
(2) පෞද්ගලික ආන්තික පිරිවැය ඉක්මවූ සමාජ ආන්තික පිරිවැයක් පවති.
(3) සමාජ ආන්තික පිරිවැය ඉක්මවූ පෞද්ගලික ආන්තික පිරිවැයක් පවතී.
(4) පෞද්ගලික ආන්තික ප්‍රතිලාභ ඉක්මවූ සමාජ ආන්තික ප්‍රතිලාභ පවතී.
(5) සමාජ ආන්තික ප්‍රතිලාභ ඉක්මවූ පෞද්ගලික ආන්තික ප්‍රතිලාභ පවතී.

32. බදු ක්‍රමය වඩාත් සාධාරණ කරනු ලබන වඩාත් තීරණාත්මක සංසිද්ධිය වනුයේ,

(1) වඩාත් සරල වන පරිදී බදු ක්‍රමය සැකසීම ය.
(2) ආදායම මත ප්‍රතික්‍රමික බදු පැනවීම ය.
(3) භාණ්ඩ මත ප්‍රතික්‍රමික බදු පැනවීම ය.
(4) ආදායම මත සමානුපාතිකව බදු පැනවීම ය.
(5) සිරස් හා තිරස් සමානාත්මතාව මත පදනම් ව බදු පැනවීම ය.

33. සැපයුම් පාර්ශවීය රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියකට අදාල ක්‍රියාකාරකමක් වනුයේ,

(1) ආදායම් මත පැනවෙන බදු ඉහළ නැංවීම. (2) කුටුම්බ මත රජය ලබා දෙන සංක්‍රාම ව්‍යදම් ඉහළ නැංවීම.

(3) රජයේ මිල දී ගැනීම් සීමා කිරීම. (4) ශ්‍රම වෙළෙඳපොළ දෘඩතාවයන් ඉවත් කිරීම.

(5) මූර්ත පොළී අනුපාතිකය පහළ දැමීම.

34. රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව (PPP) ව්‍යාපෘති මගින් ආර්ථිකයට ලැබෙන **ප්‍රබල** ප්‍රතිලාභය වන්නේ,

(1) දළ දේශීය නිමැවුම ඉහළ යාම. (2) රාජ්‍ය ව්‍යදම හා රාජ්‍ය ණය බර අවම කර ගත හැකි වීම.

(3) දේශීය මිල මට්ටම ස්ථාවර වීම. (4) මෙහෙයුම් කාර්යක්ෂමතාව ඉහළ නංවා ගත හැකි වීම.

(5) රාජ්‍ය බදු අයහාරය ඉහළ නංවා ගත හැකි වීම.

35. රාජ්‍ය මූල්‍ය සම්බන්ධ ව ප්‍රාථමික ව්‍යදමේ සංරචක වනුයේ,

(1) වර්තන ව්‍යදම්, ප්‍රාග්ධන ව්‍යදම් හා ණය ආපසු ගෙවීම්.

(2) වර්තන ව්‍යදම්, ප්‍රාග්ධන ව්‍යදම් හා ශුද්ධ ණය දීම්.

(3) ණය පොලී ගෙවීම්, වර්තන සංක්‍රාම හා ප්‍රාග්ධන ව්‍යදම්.

(4) ණය පොලී ගෙවීම් හැර අනෙකුත් වර්තන ව්‍යදම්, ප්‍රාග්ධන ව්‍යදම් හා ශුද්ධ ණයදීම්.

(5) ණය පොලී ගෙවීම් හැර අනෙකුත් වර්තන ව්‍යදම් ප්‍රාග්ධන ව්‍යදම් හා ණය ආපසු ගෙවීම්.

36. X හා Y යන රටවල ආහාර ඒකකයක් හා රෙදි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය කරන ශ්‍රම පැය ප්‍රමාණයන් පහත වගුවේ දැක්වේ.

රට	ආහාර	රෙදි
X	20	50
Y	10	20

ඉහත තොරතුරු වලට අනුව වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ කවරක් ද?

(1) ආහාර සහ රෙදි යන භාණ්ඩ දෙක ම නිපදවීමෙහි ලා සාපේක්ෂ වාසි X රටට හිමි වේ.

(2) ආහාර සහ රෙදි යන භාණ්ඩ දෙකම නිපදවීමෙහි ලා සාපේක්ෂ වාසි Yරටට හිමි වේ.

(3) ආහාර නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය X රටට හිමි වන අතර රෙදි නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය Y රටට හිමි වේ.

(4) ආහාර නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය Y රටට හිමි වන අතර රෙදි නිෂ්පාදනයේ සාපේක්ෂ වාසිය X රටට හිමි වේ.

(5) කවර භාණ්ඩයක් හෝ නිෂ්පාදනය කිරීමේ සාපේක්ෂ වාසි කිසිදු රටකට හිමි නොවේ.

37. කල්පිත ආර්ථිකයක් සම්බන්ධයෙන් පහත තොරතුරු සපයා ඇත.

වර්ෂය	2021	2023	2024
අපනයන මිල දර්ශකය	100	120	156
ආනයන මිල දර්ශකය	100	96	120

2023 වර්ෂයට සාපේක්ෂ ව 2024 වර්ෂයේ දී අපනයන ඒකකයක ආනයන ක්‍රය ශක්තිය වෙනස්වීම.

(1) 4% කි. (2) 8% කි. (3) 5% කි. (4) 10% කි. (5) 12% කි.

38. 2024, මහ බැංකු වාර්ෂික විවරණය අනුව ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයන අයිතම **තුන** වනුයේ,

(1) ඉන්ධන , යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍ය ය.

(2) ඉන්ධන , රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ය.

(3) ඉන්ධන , රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ ප්‍රවාහන උපකරණ ය.

(4) ඉන්ධන , රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ ප්‍රවාහන උපකරණ ය.

(5) ඉන්ධන , ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ ය.

39. නම්‍ය විනිමය අනුපාතිකය යටතේ රුපියලේ අගය පහළ යාමට හේතුවක් වනුයේ,

(1) ආනයනවලට සාපේක්ෂව අපනයන සඳහා ඉල්ලුම වැඩි වශයෙන් ඉහළ යාම ය.

(2) අපනයන වලට සාපේක්ෂව ආනයන සඳහා ඉල්ලුම වැඩි වශයෙන් ඉහළ යාම ය.

(3) ආනයන මිලට සාපේක්ෂව අපනයන සඳහා මිල වැඩි වශයෙන් ඉහළ යාම ය.

(4) අපනයන මිලට සාපේක්ෂව ආනයන වල මිල පහළ යාම ය.

(5) මහ බැංකුව ඒකාබද්ධ පුළුල් මුදල් සැපයුම ඉහළ දැමීම තුළිනි.

40. පහත සඳහන් අයිතම් අතරින් ගෙවුම් ශේෂ ලේඛනයේ ජංගම ගිණුම තුළ අන්තර්ගත ද්විතීයික ආදායම් ගිණුමේ සටහන් කරනු ලබන අයිතම වනුයේ,

A - නේවාසිකයින් හා අනේවාසිකයින් අතර සිදුවන රාජ්‍ය හා පෞද්ගලික සියලුම වර්තන සංක්‍රාම .

B - රාජ්‍යයන් දෙකක් අතර හුවමාරු වන ඖෂධ පරිත්‍යාගයන්.

C - නිෂ්පාදනය නොකළ මූල්‍යමය නොවන ස්වභාවික සම්පත් බදු දීමෙන් ලබන ආදායම්.

D - වරලත් වෙළෙඳ නාමයන් ආශ්‍රයෙන් උපයාගනු ලබන ආදායම්.

E - මූල්‍ය වත්කම් සහ ආයෝජන ආශ්‍රයෙන් හට ගන්නා පොලී ආදායම්.

(1) A හා E පමණි. (2) A හා B පමණි. (3) C, D හා E පමණි.

(4) A, B හා D පමණි. (5) B, C හා E පමණි.

41. තෝරාගත් ආර්ථිකයක 2025 වර්ෂයට අදාළ ජංගම ගිණුම පිළිබඳ පහත විස්තර සපයා ඇත.

(සියළුම සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)

භාණ්ඩ අපනයන	600	භාණ්ඩ ආනයන	1000
සේවා (ශුද්ධ) ආදායම්	120	ප්‍රාථමික ආදායම් ලැබීම්	480
ප්‍රාථමික ආදායම් ගෙවීම්	600	ද්විතීතික ආදායම් ගිණුමේ ශේෂය	150
ප්‍රාග්ධන සංක්‍රාම (ශුද්ධ)	20		

වැරදි හා අත්හැරීම් කිසිවක් නොපැවතියේ නම් මූල්‍ය ගිණුමේ ශේෂය,

(1) රු.මි. 230 ක අතිරික්තයකි. (2) රු.මි. 230 ක හිඟයකි. (3) රු.මි. 250 ක අතිරික්තයකි.

(4) රු.මි. 250 ක හිඟයකි. (5) රු.මි. 400 ක හිඟයකි.

42. රටවල් **පහක** අපනයන ඉල්ලුම් නම්‍යතා හා ආනයන ඉල්ලුම් නම්‍යතා පහත වගුව පෙන්නුම් කරයි.

රට	අපනයන ඉල්ලුම් නම්‍යතාව	ආනයන ඉල්ලුම් නම්‍යතාව
A	0.8	0.4
B	0.6	0.7
C	0.4	0.6
D	0.8	1.4
E	0.8	0.1

එක් එක් රට තම මුදල් ඒකකය එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව 15% කින් අවප්‍රමාණය කිරීමට ගනු ලබන තීරණය, දැනට පවතින වෙළෙඳ හිඟය තවදුරටත් ඉහළ නැංවීමට හේතු වන රට වනුයේ,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය. (5) E ය.

43. **ආර්ථික සංවර්ධනය** යන සංකල්පය වඩාත් නිවැරදිව නිරූපනය වන ප්‍රකාශය වන්නේ,

(1) දිගු කාලීනව නිෂ්පාදනය ප්‍රමාණාත්මක ව වර්ධනය වීමකි.

(2) නිෂ්පාදනය ප්‍රමාණාත්මක ව, ගුණාත්මක ව සහ ව්‍යුහාත්මකව වෙනස් වීමේ ක්‍රියාවලියකි.

(3) ආර්ථික සමාජයීය සහ පාරිසරික යන පැතිකඩ ඔස්සේ තුලනාත්මක ව සිදුවන සංවර්ධනයකි.

(4) ආර්ථික , සමාජයීය හා සංස්කෘතික පැතිකඩ ඔස්සේ ජනතාවගේ ජීවන තත්ත්වය වර්ධනය වීමකි.

(5) ජනතාවගේ සාමාර්ථතාවයන් සහ හිමිකම් රටාව වෙනස් වීමේ ක්‍රියාවලියකි.

44. ශ්‍රී ලංකාව, අනෙකුත් දකුණු ආසියාතික රටවල් හා සසඳන කල ඉහළ සාක්ෂරතාවක් සහ ඉහළ ආයු අපේක්ෂණයක් පෙන්නුම් කරන රටකි. එහෙත් මෑත කාලීන දත්ත වලට අනුව ශ්‍රී ලංකාවේ මානව සංවර්ධන දර්ශකයේ අගය සුළු පසුබෑමක් පෙන්නුම් කරයි. මානව සංවර්ධන දර්ශකය තව දුරටත් ඉහළ නැංවීම සඳහා වැඩිම විභවතාවක් පවතින්නේ පහත සඳහන් කවර ක්‍රියාකාරකම සඳහා ද?

(1) සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම. (2) පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම.

(3) පාසල් හැරයන සිසුන් සංඛ්‍යාව අවම කිරීම. (4) ක්‍රය ශක්ති සාම්‍ය දළ ජාතික ආදායම ඉහළ නැංවීම

(5) අධ්‍යාපනය හා සෞඛ්‍ය සඳහා රජය දරන වියදම් ඉහළ නැංවීම.

45. ශ්‍රී ලංකාවේ ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ජාතික බහුමාන දරිද්‍රතා දර්ශකය සකස් කිරීමේදී ජනතාවගේ ජීවන තත්ත්වය මිනුම් කිරීමේ විහීනතාවක් ලෙස යොදා **නොගන්නේ**,

(1) නිදන්ගත රෝග. (2) නිවාසවල තත්ත්වය. (3) සනීපාරක්ෂාව.

(4) පානීය ජලය. (5) වත්කම්.

46. X සහ Y යන රටවලට අදාල ගිනි සංගුණකයේ අගය 2024 සහ 2025 වර්ෂය සඳහා පහත පරිදි වේ.

රට	2024, ගිනි සංගුණකය	2025, ගිනි සංගුණකය
X	0.3	0.5
Y	0.6	0.4

ඉහත දත්ත වලට අනුව නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) රටවල් දෙකෙහිම ආදායම් බෙදී යාමේ කිසිදු විෂමතාවක් දැකිය නොහැක.

(2) රටවල් දෙකෙහිම ආදායම් බෙදී යාමේ විෂමතාවය වැඩි වීමක් දැකිය හැකිය.

(3) X රටෙහි ආදායම් බෙදී යාමේ විෂමතාව වැඩි වී ඇති අතර Y රටෙහි ආදායම් බෙදී යාමේ විෂමතාව අඩුවී ඇත.

(4) රටවල් දෙකෙහිම ආදායම් බෙදී යාමේ විෂමතාව අඩුවී ඇත.

(5) Y රටෙහි ආදායම් බෙදීයාමේ විෂමතාව වැඩි වී ඇති අතර X රටෙහි ආදායම් බෙදීයාමේ විෂමතාව අඩුවී ඇත.

47. A රටෙහි ජනගහනය පිළිබඳ දත්ත පහත පරිදි වේ. (සියලුම සංඛ්‍යා මිලියන වලිනි.)

මුළු ජනගහනය	250
වැඩ කරන වයසේ ජනගහනය	200
සේවා නියුක්ත ජනගහනය	80
සේවා වියුක්ත ජනගහනය	20

ඉහත දත්ත වලට අනුව මෙම රටෙහි ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සහ විරැකියා අනුපාතිකය අනුපිළිවෙලින් නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,

(1) 60% සහ 15% ය. (2) 50% සහ 20% ය. (3) 25% සහ 75% ය.

(4) 80% සහ 20% ය. (5) 80% සහ 45% ය.

48. වර්තමාන මහ බැංකු දත්ත වලට අනුව ශ්‍රී ලංකාවේ ළමා යැපුම් අනුපාතය සහ වැඩිහිටි යැපුම් අනුපාතය නිවැරදි ව දැක්වෙන පිළිතුර වන්නේ,

	ළමා යැපුම් අනුපාතය	වැඩිහිටි යැපුම් අනුපාතය
(1)	34.8 %	37.22 %
(2)	37.77%	11.71 %
(3)	31.00 %	18.82%
(4)	26.27 %	33.33%
(5)	12.50%	20.50%

49. 2024 වසරේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ආර්ථික පරිවර්තන පනතේ මූලික අරමුණක් **නොවන්නේ** පහත සඳහන් කවරක්ද?

(1) ඉහළ තරගකාරිත්වයක් සහිත අපනයනාභිමුඛ ඩිජිටල් ආර්ථිකයක් බවට පරිවර්තනය කිරීම.

(2) ස්වයංපෝෂිත ජාතික ආර්ථිකයක් බිහි කිරීම.

(3) 2050 වසර වන විට කාබන් විමෝචනය ශූන්‍යය කිරීම.

(4) ගෝලීය ආර්ථිකය සමග ඒකාබද්ධ වීම වැඩි කිරීම.

(5) සාර්ව ආර්ථික ස්ථායිතාවය සහ ණය තිරසර භාවය සාක්ෂාත් කර ගැනීම.

50. නැගී එන වෙළෙඳපොළ ආර්ථික රටවල් සමූහයක් වන BRICS සමග 2023 වසරේ දී අලුතින් එකතු වූ රටවල් කාණ්ඩය වනුයේ,

(1) ඉරාකය , ඉන්දුනීසියාව සහ ඉතියෝපියාව (2) පිලිපීනය , ඉන්දියාව සහ ඉතියෝපියාව

(3) ඉරානය, ඉන්දුනීසියාව සහ ඉතියෝපියාව (4) ඊජිප්තුව, චීනය සහ දකුණු අප්‍රිකාව

(5) ඉතියෝපියාව, දකුණු අප්‍රිකාව සහ ඉරානය

****

සියලු ම හිමිකම් ඇවිරිණි / முழிப் பதிப்பரிமையடையது /All Rights Reserved

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව , 2026
கல்விப் பொது தராதர (உயர்தரப்) பரீட்சை – கற்றலுக்கான உதவி மதிப்பீடு, 2026
General Certificate of Education (Adv. Level) Supportive Assesment , 2026

ආර්ථික විද්‍යාව II பொருளியல் II Economics II	21	S	II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදන්න

උපදෙස් :

- "අ " උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද "ආ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

"අ" උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

1. (i) "ආර්ථික විද්‍යාවේ පදනම හිහකම වේ". මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) පාරිභෝගිකයින් හට නොමිලේ ලැබෙන ඇතැම් භාණ්ඩ ආර්ථික විද්‍යාවේ නොමිල භාණ්ඩ ලෙස නොසැලකෙන්නේ ඇයි ද යන්න සුදුසු නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) ස්වභාවික සම්පත් අවභාවිතයේ ප්‍රතිවිපාක කවරේ ද? (ලකුණු 04යි)

(iv) පූර්ණ සම්පත් උපයෝජනය සිදුකර ඇති ආර්ථිකයක , නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය දකුණට විතැන් කළ හැකි ආකාර **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(v) (අ) මූලික ආර්ථික ගැටළු අතරින් නිෂ්පාදන ගැටළුව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) මිශ්‍ර ආර්ථික පද්ධතියක් විසින් නිෂ්පාදන ගැටළුව විසඳනු ලබන්නේ කෙසේ ද? (ලකුණු 02යි)

2. (i) සැපයුම් නීතිය පැහැදිලි කර ඊට බලපාන හේතු සඳහන් කරන්න. (ලකුණු 04යි)

(ii) X නමැති භාණ්ඩයේ වෙළෙඳපොළ තොරතුරු පහත දැක්වේ.

ඒකකයක මිල (රු.)	ඉල්ලුම් ප්‍රමාණය (ඒකක)	අධි සැපයුම් ප්‍රමාණය (ඒකක)
10	180	-160
60	80	40

(අ) ඉහත භාණ්ඩයේ සමතුලිත මිල හා ප්‍රමාණය ප්‍රස්තාර සටහනකින් දක්වන්න. (ලකුණු 04යි)

(ආ) සමතුලිතයේ දී ආර්ථික අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 03යි)

(ඉ) සමතුලිත මිලෙහි දී ඉල්ලුම් නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 02යි)

(iii) කිසියම් භාණ්ඩයක ඉල්ලුම අනම්‍ය වීමට බලපාන සාධක සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iv) වෙළෙඳපොළ සමතුලිතයක දැකිය හැකි ලක්ෂණ කවරේ ද? (ලකුණු 03යි)

[දෙවෙනි පිටුව බලන්න

3. (i) තරහකාරී වෙළඳපොළක අලෙවි වන භාණ්ඩයක් සඳහා උපරිම මිලක් නියම කිරීමේ ආර්ථික ප්‍රතිවිපාක රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) වෙළෙඳපොළෙ හි අලෙවි වන භාණ්ඩයක් සඳහා අවම මිල නියම කිරීම, සමාජ ශුභසාධනය කෙරෙහි කවර බලපෑමක් ඇති කරනු ලැබේ ද? රූප සටහනක් ආධාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) කෘෂිකාර්මික භාණ්ඩවල මිල ස්ථාවර කිරීම සඳහා රජය යොදාගන්නා ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 04යි)

(iv) කාර්මික භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

Qd = 800 – 10P Qs = -200 + 10P

(අ) වෙළඳපොළ සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02යි)

(ආ) මෙම භාණ්ඩ ඒකකයක් සඳහා රජය විසින් රු. 10 ක බද්දක් නිෂ්පාදකයා මත පනවනු ලැබුව හොත් රජයට ලැබෙන බදු ආදායම කොපමණ ද ? (ලකුණු 02යි)

(ඉ) බදු පැනවීමෙන් පසු ආර්ථික අතිරික්තයේ වෙනස කොපමණ ද? (ලකුණු 02යි)

(ඊ) බදු පැනවීමෙන් පසු අහිමි වන ශුභසාධනයේ ප්‍රමාණය ගණනය කර දක්වන්න. (ලකුණු 02යි)

4. (i) කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය හා දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිතය අර්ථ දක්වන්න. (ලකුණු 04යි)

(ii) කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ න්‍යාය කුමක් ද? එය අර්ථ දක්වන්න. (ලකුණු 02යි)

(iii) පහත සඳහන් අවස්ථා විචල්‍ය පිරිවැය ,ස්ථාවර පිරිවැය හෝ ගිලුණු පිරිවැය යන පිරිවැය ස්වරූපයන්ගෙන් කවරකට අයත් වේ දැ' යි සඳහන් කරන්න.

(අ) ලී බඩු නිෂ්පාදන ආයතනයක් රු.500,000 ක් වැය කර ලී කපන යන්ත්‍රයක් මිල දී ගැනීම.

(ආ) එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා රු.60,000 ක් වැය කර එය අවසන් කිරීමට පෙර අත්හැර යාම.

(ඉ) නිෂ්පාදන ආයතනයක් විසින් සේවකයින් හට දෛනික වැටුප් ගෙවීම.

(ඊ) නව සිසිල් බීම නිෂ්පාදන ආයතනයක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීම. (ලකුණු 01x4 = 04යි)

(iv) පූර්ණ තරහකාරී ආයතනයක පිරිවැය ආශ්‍රිත දත්ත පහත දැක්වේ.

නිමැවුම (ඒකක)	1	2	3	4	5	6	7
මුළු පිරිවැය (රු.)	11	13	17	25	37	52	70

මෙම ආයතනය විසින් නිෂ්පාදනයය කරන භාණ්ඩ ඒකකයක මිල රු.8ක් වන්නේ නම්,

(අ) ආයතනයේ සාමාන්‍ය අයභාරය සහ ආන්තික අයභාරය කොපමණ ද? (ලකුණු 02යි)

(ආ) MR = MC ප්‍රවේශය මත ආයතනයේ ලාභ උපරිම කෙරෙන නිමවුම් මට්ටම කොපමණ ද? (ලකුණු 02යි)

(v) (අ) පූර්ණ තරගකාරී වෙළෙඳපාළක් සහ ඒකාධිකාරී තරග වෙළෙඳපොළක් අතර දක්නට ලැබෙන වෙනස්කම් **දෙකක්** පෙන්වා දෙන්න. (ලකුණු 02යි)

(ආ) සාධක වෙළෙඳපොළ තුල සියලුම ඉපයීම් සංක්‍රාම ඉපයීම් වලින් හා සියලුම ඉපයීම් ආර්ථික බදු කුළියෙන් පමණක් සමන්විත වන්නේ කවර තත්ත්වයක් යටතේ ද? යෝග්‍ය ප්‍රස්ථාර සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

5. (i) ජාතික ගිණුම්කරණය හා සම්බන්ධ නිමැවුමේ දළ වටිනාකම, අතරමැදි යෙදවුම් හා ප්‍රාථමික යෙදවුම් යන සංකල්ප හඳුන්වන්න. (ලකුණු 03යි)

(ii) පහත දැක්වෙන ආර්ථික ක්‍රියාකාරකම් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම සඳහා ඇතුළත් කරන්නේ ද? නැද්ද? ඔබේ පිළිතුර හේතු සහිත ව දක්වන්න.

(අ) ගෘහ සෙවිකාවන් වැටුප් ලබමින් ආහාර පිසීම.

(ආ) වාණිජ බැංකුවක් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය පහසුකම් ලබා ගැනීම.

(ඉ) මූල්‍ය ආයතනයක් ණය සැපයීම මගින් පොළී ආදායම් උපයා ගැනීම.

(ඊ) පාසැල් ගුරුවරියක් තම දරුවාට නිවසේ දී පාඩම් ඉගැන්වීම. (ලකුණු 01x4 = 04යි)

(iii) කල්පිත ආර්ථිකයක් සම්බන්ධයෙන් 2025 වර්ෂයට අදාළව පහත තොරතුරු ඔබට සපයා ඇත.

(සියලුම සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)

සේවක ඉපයීම්	3300	නිෂ්පාදනය මත අනෙකුත් ශුද්ධ බදු	150
ශුද්ධ මෙහෙයුම් අතිරික්තය	6000	විදේශ ප්‍රාථමික ආදායම් ගෙවීම්	470
කුටුම්භ අංශයේ අවසන් පරිභෝජනය	8000	ගෙවුම්තුලනයේ ද්විතියික ආදායම් ගිණුමේ ශේෂය	1200
ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය	800	දළ මිශ්‍ර ආදායම්	750
විදේශ ප්‍රාථමික ආදායම් ලැබීම්	180	භාණ්ඩ හා සේවා මත (ශුද්ධ) බදු	500
රාජ්‍ය අංශයේ අවසන් පරිභෝජනය	1000	දළ ප්‍රග්ධන සම්පාදනය	3700

ඉහත තොරතුරු ඇසුරින් පහත දෑ ගණනය කරන්න.

(අ) මූලික මිල මත සමස්ත එකතු කළ අගය.

(ආ) වෙළඳ මිල මත දළ දේශීය නිෂ්පාදිතය.

(ඉ) දළ ජාතික ආදායම.

(ඊ) වැය කළ හැකි ජාතික ආදායම.

(උ) ජාතික ඉතුරුම් (ලකුණු 01x5 = 05යි)

(iv) සමාහාර ඉල්ලුම නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(v) කිසියම් ආර්ථිකයක සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වයට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

(සියලුම සංඛ්‍යා රු. බිලියන වලිනි)

ඉතුරුම් ශ්‍රිතය (S) = $- 500 + 0.4Y_d$

බදු (T) = 340

සංක්‍රාම (TR) = 40

ආනයන (M) = 160

මුළු විදීම් (J) = 540

(අ) සමතුලිත ජාතික ආදායම් මට්ටම ගණනය කරන්න. (ලකුණු 02යි)

(ආ) මෙම ආර්ථිකයේ රජයේ මිල දී ගැනීම් හා රජයේ සංක්‍රාම වියදම් සමාන ප්‍රමාණයකින් ඉහළ නැංවීම සමතුලිත ජාතික ආදායම් මට්ටම කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න (ලකුණු 04යි)

"ආ" උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් **ප්‍රශ්න දෙකක්** තෝරා ගන්න.)

6. (i) (අ) මහජනතාව මුදල් ඉල්ලුම් කරන්නේ ඇයි? (ලකුණු 03යි)

(ආ) මූර්ත ආදායමත් මුදල් ඉල්ලුමත් අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරන්න. (ලකුණු 03යි)

(ii) M_4 මූල්‍ය සමාහාරය තුළ ඇතුළත් සංරචක සඳහන් කරන්න. (ලකුණු 04යි)

(III) (අ) ආර්ථිකයක පවතින උද්ධමනකාරී තත්ත්වය එම ආර්ථිකයේ ආයෝජන සහ ඉතුරුම් වලට බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ආ) නිෂ්පාදකයාගේ මිල දර්ශකයේ ප්‍රායෝගික වැදගත්කම් **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

(IV) එක් දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය යනු කුමක්ද? මෙය ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

7. (i) වෙළෙඳපොළ අසමත්වීම, පැහැදිලි කර ඊට බලපාන හේතු සඳහන් කරන්න. (ලකුණු 04යි)

(II) ඍණ බාහිරතා සහිත පාරිභෝජන ක්‍රියා සම්බන්ධයෙන් වෙළෙඳපොළ තුළ ඌන පරිභෝජනක් ඇති වේ ද? අධි පරිභෝජනයක් ඇති වේ ද? සුදුසු රූප සටහනක් ඇසුරෙන් පිළිතුරු පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(III) ව්‍යවස්ථාපිත බදු ආපාතය හා ආර්ථික බදු ආපාතය යන සංකල්ප පැහැදිලි කර, එම බදු ආපාත අතර වෙනසක් ඇතිවන්නේ කෙසේදැ'යි පෙන්වා දෙන්න. (ලකුණු 04යි)

(IV) ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය, රාජ්‍ය මූල්‍ය නිර්ණායක ඇසුරෙන් අනාවරණය වන්නේ කෙසේද? පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(V) කල්පිත ආර්ථිකයක රාජ්‍ය මූල්‍ය පිළිබඳ තොරතුරු පහත දැක්වේ. (සියලුම සංඛ්‍යා රුපියල් බිලියන වලිනි)

බදු ආදායම	3700	බදු නොවන ආදායම	200
ප්‍රදාන	150	පුනරාවර්තන වියදම	4300
ණය පොලී ගෙවීම්	1900	ප්‍රාග්ධන වියදම	600
ශුද්ධ ණය දීම්	100	ණය ආපසු ගෙවීම්	1400

ඉහත සංඛ්‍යා ඇසුරෙන් පහත දෑ ගණනය කරන්න.

(අ) වර්තන ගිණුමේ ශේෂය

(ආ) ප්‍රාථමික ශේෂය

(ඉ) සමස්ත අයවැය ශේෂය

(ඊ) දළ මූල්‍යයන අවශ්‍යතාව (ලකුණු 01x4 = 04යි)

8. (i) රෙදි හා සීනි යන භාණ්ඩ දෙක සම්බන්ධයෙන් X හා Y යන රටවල් දෙකෙහි ශ්‍රමිකයකුගේ සාමාන්‍ය ඵලදාව පහත ලේඛනයේ දැක්වේ.

රට	රෙදි (මීටර්)	සීනි (කිලෝ ග්‍රෑම්)
X	10	06
Y	04	06

(අ) ඒ ඒ රටට සාපේක්ෂ වාසි ඇත්තේ කුමන භාණ්ඩ සම්බන්ධයෙන් ද? (ලකුණු 02යි)

(ආ) රටවල් දෙකෙහි ම ශ්‍රමිකයන් දහස (1000) බැගින් සිටි යැයි ද, විශේෂීකරණයට පෙර එක් එක් කර්මාන්තයන් හි ශ්‍රමිකයන් 500 බැගින් සේවා නියුක්තව සිටියේ යැයි ද සිතන්න. සාපේක්ෂ වාසිය මත පදනම් වූ විශේෂිකරණය නිසා ගෝලීය නිෂ්පාදනය වෙනස් වී ඇති ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 02යි)

(ඉ) X හා Y දෙරට අතර අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වෙළෙඳාමක් හට ගැනීමට නම් , මෙම භාණ්ඩ හුවමාරු විය යුත්තේ කවර අනුපාතයකට ද? (ලකුණු 02යි)

(II) ආරක්ෂණවාදයට එරෙහි ව ඉදිරිපත් වන තර්ක කවරේද? (ලකුණු 04යි)

(III) ද්විත්ව සටහන් මූලධර්මයට අනුකූල ව පහත සඳහන් ගනුදෙනු ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනයෙහි වාර්තා කරන්නේ කෙසේද?

(අ) කටාර් රාජ්‍යයෙහි සේවය කරන ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවක්, ඩොලර් 200 ක මුදලක් ලංකාවේ සිටින තම මව්පියන් වෙත එවීම.

(ආ) සංචාරක ඉපයීම් ලෙස ශ්‍රී ලංකාවට ඩොලර් මිලියන 1136 ක ආදායමක් ලැබීම.

(ඉ) ශ්‍රී ලංකාවට චීන රජයෙන් රු.බි. 500 ක ණය මුදලක් ලැබීම.

(ඊ) ඇමරිකානු රජයෙන් ශ්‍රී ලංකා රජයට ඩො.මි.400 ක් වටිනා ගුවන්යානා පරිත්‍යාගයක් ලැබීම. (ලකුණු 01x4 = 04යි)

(IV) (අ) විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීම හා ක්ෂයවීම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) "විනිමය අනුපාතිකය අවප්‍රමාණය කළ පමණින් එහි අපේක්ෂිත අරමුණු ඉටු නොවේ" මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

9. (i) "කිසියම් රටක් සංවර්ධනය කරා ගමන් කිරීමේ දී ආර්ථික වර්ධනය අත්‍යවශ්‍ය සාධකයක් වුව ද එය පමණක් ප්‍රමාණවත් නොවේ" මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී ඇති තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකර ගැනීමට යාමේ දී රටවල් මුහුණ දෙන අභියෝග කවරේ ද? (ලකුණු 04යි)

(iii) නිරපේක්ෂ දරිද්‍රතාව සහ සාපේක්ෂ දරිද්‍රතාව යන සංකල්ප අතර වෙනස දක්වා , නිරපේක්ෂ දරිද්‍රතාව මැනීමට උපයෝගි කර ගන්නා මිනුම් සඳහන් කරන්න. (ලකුණු 04යි)

(iv) ශ්‍රී ලංකා මහ බැංකු දත්තවලට අනුව 2024 /2025 වසරවල ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන අනුපාතිකය 5% කි. එහෙත් ශ්‍රී ලංකාවේ ආදායම් බෙදී යාමේ සැලකිය යුතු විෂමතාවයක් පවතී. ආර්ථික වර්ධනය අත්පත් කර ගන්නවාත් සමඟ ම, ආදායම් බෙදී යාමේ සැලකිය යුතු විෂමතාව අවම කර ගැනීමට රජයට ගත හැකි ක්‍රියා මාර්ග දක්වන්න. (ලකුණු 04යි)

(v) මෑත කාලීන දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ තරුණ ජනගහනය තුළ විරැකියා අනුපාතිකය සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. මෙම තත්ත්වයට බලපා ඇති හේතු කවරේ ද? (ලකුණු 04යි)

10. (i) 2015-2024 දක්වා කාලය තුල වයස අවුරුදු 14 ට අඩු ජනගහනය 24% සිට 21% දක්වා පහත වැටී ඇති බව මහ බැංකු දත්ත ඇසුරින් හෙළි වේ. මෙබඳු පහත වැටීමක් කෙරෙහි බලපා ඇති සාධක හා එමගින් ආර්ථිකය මත ඇති කරන බලපෑම් පෙන්වා දෙන්න. (ලකුණු 05යි)

(ii) ඇමරිකානු රජය විසින් මෑත කාලයේ පනවන ලද තීරුබදු ප්‍රතිපත්තිය, ශ්‍රී ලංකාවේ ආර්ථිකය මත ඇති කළ බලපෑම පරීක්ෂා කරන්න. (ලකුණු 05යි)

(iii) වෙළෙඳපොළ හුවමාරු ක්‍රියාවලියේ දී භෞතික මුදල් භාවිතය වෙනුවට විද්‍යුත් මුදල් භාවිතයේ වාසි , අවාසි දක්වන්න. (ලකුණු 05යි)

(iv) (අ) ශ්‍රී ලංකාව සිය විදේශ වෙළෙඳාම ශක්තිමත් කර ගැනීම සඳහා ඇති කර ගන්නා ලද ද්වි-පාර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් කවරේ ද? (ලකුණු 02යි)

(ආ) මෙවැනි වෙළෙඳ ගිවිසුම්වල අරමුණු දක්වන්න. (ලකුණු 03යි)

****

General Certificate of Education (Adv. Level) Supportive Assessment, 2026 Answer Sheet

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව, 2026 උත්තර පත්‍රය

ආර්ථික විද්‍යාව I

Economics I

ප්‍රශ්න අංකය	පිලිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිලිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිලිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිලිතුරු අංකය	ප්‍රශ්න අංකය	පිලිතුරු අංකය
01.	3	11.	5	21.	3	31.	2	41.	1
02.	5	12.	4	22.	5	32.	5	42.	5
03.	1	13.	3	23.	3	33.	4	43.	2
04.	4	14.	1	24.	4	34.	2	44.	4
05.	4	15.	3	25.	2	35.	4	45.	1
06.	2	16.	4	26.	2	36.	3	46.	3
07.	2	17.	2	27.	2	37.	1	47.	2
08.	4	18.	1	28.	5	38.	2	48.	3
09.	4	19.	2	29.	4	39.	2	49.	2
10.	1	20.	1	30.	4	40.	2	50.	3

සියලු ම හිමිකම් ඇවිරිණි / *முழுப் பதிப்புரிமையுடையது* /All Rights Reserved

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) උපකාරක තක්සේරුව , **2026**

கல்விப் போதுத் தராதரப் பத்திர (உயர் தரப்) கற்றலுக்கான உதவி மதிப்பீடு , 2026

General Certificate of Education (Adv. Level) Supportive Assessment, 202**6**

ආර්ථික විද්‍යාව	**II**	**21 S II**
பொருளியல்	**II**	
Economics	**II**	

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - **මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - **10 minutes**

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදන්න

උපදෙස් :

- "අ " උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද "ආ" උප කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** ද තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- ප්‍රස්තාර කඩදාසි සපයනු ලැබේ.

"අ" උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්** තෝරා ගන්න.)

01 වන ප්‍රශ්නය

(i) "ආර්ථික විද්‍යාවේ පදනම හිහකම වේ". මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) පාරිභෝගිකයින් හට නොමිලේ ලැබෙන ඇතැම් භාණ්ඩ ආර්ථික විද්‍යාවේ නොමිල භාණ්ඩ ලෙස නොසැලකෙන්නේ ඇයි ද යන්න සුදුසු නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) ස්වභාවික සම්පත් අවභාවිතයේ ප්‍රතිවිපාක කවරේ ද? (ලකුණු 04යි)

(iv) පූර්ණ සම්පත් උපයෝජනය සිදුකර ඇති ආර්ථිකයක , නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය දකුණට විතැන් කළ හැකි ආකාර **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04යි)

(v) (අ) මූලික ආර්ථික ගැටළු අතරින් නිෂ්පාදන ගැටළුව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) මිශ්‍ර ආර්ථික පද්ධතියක් විසින් නිෂ්පාදන ගැටළුව විසඳනු ලබන්නේ කෙසේ ද? (ලකුණු 02යි)

01

(i) අසීමිත වුවමනා සපුරාලීම සඳහා ආර්ථිකයක් සතු සීමිත සම්පත් ප්‍රමාණවත් නොවීම හිහකමයි.

විකල්ප පිළිතුරු

අසීමිත වුවමනා හා සීමිත සම්පත් අතර නොගැළපෙන තත්ත්වය හිහකමයි. (ලකුණු 01)

~ හිහකම යනු සාපේක්ෂ සංකල්පයකි.

~ හිහකම යනු දිළිඳුකම නොවේ.

~ දුප්පත් පොහොසත් සෑම රටකටම පොදු තත්ත්වයකි.

~තාවකාලික ව සැපයුමේ ඇතිවන හිඟයක් හිහකම නොවේ.

~ සම්පත් කාර්යක්ෂම උපයෝජනය තුළින් හිහකම තුරන් කළ නොහැකිවේ. (කරුණු දෙකකට ලකුණු 02)

උවමනා අසීමිත වීම හා භාණ්ඩ නිපදවීමට ඇති ආර්ථික සම්පත් සීමිත වීමත්, සීමිත සම්පත් විකල්ප භාවිත හැකියාවන්ගෙන් යුක්ත වීමත් නිසා විකල්ප අතර තේරීම් කිරීමට සිදුවේ. මෙම තේරීම් කිරීමට අවශ්‍ය මහ පෙන්වීම ආර්ථික විද්‍යාව තුළින් සිදුවේ.

ආර්ථික විද්‍යාව විෂය තුළින් විකල්ප භාවිත සහිත සීමිත සම්පත් යොදා ගනිමින් වුවමනා ඉටු කර ගැනීමට අවශ්‍ය තාර්කික මග පෙන්වීම සිදුකරන නිසා එය ආර්ථික විද්‍යාවේ පදනම ලෙස සැමදා පවතිනු ඇත. (ලකුණු 01)

(ii) ආර්ථික විද්‍යානුකූලව නොමිල භාණ්ඩ යනුවෙන් අදහස් කරන්නේ, සැපයුමක් ඇති විට සම්පත් පිරිවැයකින් හෝ අවස්ථික පිරිවැයකින් තොරව මිනිස් වුවමනා ඉටු කර ගැනීමට භාවිතා කළ හැකි හිරුඑළිය, වැසි ජලය, භූගත ජලය වැනි ස්වභාවික සම්පත් ය. මෙවා ස්වභාවධර්මයා විසින් නොමිලයේ නිපදවා නොමිලයේ ම ලබා දෙයි.

අදාළ පුද්ගලයා විසින් කිසිදු මිලක් ගෙවීමකින් තොරව සිය අවශ්‍යතා ඉටු කර ගැනීමට අවශ්‍ය ඇතැම් භාණ්ඩ හා සේවා නොමිලයේ ලැබෙන අවස්ථා පවතී. උදාහරණ ලෙස පාසල් නිල ඇඳුම්, පෙළපොත් , රජයේ රෝහල්වලින් ලැබෙන ඖෂධ, රජයේ පාසල් වලින් ලැබෙන නිදහස් අධ්‍යාපනය ආදිය පාරිභෝජනයේ දී අදාළ පාරිභෝගිකයා විසින් ගෙවීමක් සිදු නොකරයි. නමුත් මේ සියල්ල මිනිස් තීරණයක ප්‍රතිඵල ලෙස සම්පත් පිරිවැයක් හා අවස්ථික පිරිවැයක් දරා නිපදවා ඇති භාණ්ඩ වේ. එනම් ආර්ථික භාණ්ඩ වෙයි.
ඒ අනුව අදාළ පාරිභෝගිකයා විසින් මිලක් ගෙවීමකින් තොරව නොමිලයේ පරිභෝජනය කළ ද සම්පත් පිරිවැයක් හා අවස්ථික පිරිවැයක් දරා නිපදවා ඇති භාණ්ඩ ආර්ථික නොවන භාණ්ඩ (නොමිල භාණ්ඩ) ලෙස සැලකිය නොහැකි බව පැහැදිලිය.
(ලකුණු 02)

(iii) වායු ගෝලීය උණුසුම ඉහළ යාම
ග්ලැසියර් දියවීම
ඕසෝන් වියන සිදුරුවීම
ජල හිඟයන්ට මුහුණ දීම
වනසතුන්ගෙන් සිදුවන හානි
ගංවතුර, නාය යෑම වැනි ස්වභාවික විපත්

(ඕනෑම කරුණු හතරකට ලකුණු 04)

(iv) තාක්ෂණික දැනුම
මානව ප්‍රාග්ධනය
සමාජ ප්‍රාග්ධනය
වෘත්තිය ආචාර ධර්ම
ශ්‍රම විභජනය
විශේෂීකරණය
කළමනාකරණය (ඕනෑම කරුණු තුනකට ලකුණු 03)

(v) (අ) නිෂ්පාදන ගැටළුව /කෙසේ නිපදවනවා ද? යන ගැටළුව යනු භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සඳහා කුමන ශිල්ප ක්‍රමයක්, කුමන තාක්ෂණයක් භාවිතා කරන්නේද? යන්න තීරණය කිරීමයි.

විකල්ප පිළිතුරු

භාණ්ඩ නිපදවීමට කවර සම්පත් කවර අනුපාතයකට භාවිතා කළ යුතුද යන්න තීරණය කිරීම , විකල්ප ශිල්ප ක්‍රම අතුරින් කවර ශිල්ප ක්‍රමය තෝරාගත යුතු ද යන්න තීරණය කිරීම සිදුවන නිසා නිෂ්පාදන ගැටලුව ලෙස හඳුන්වයි.
(ලකුණු 02)

(ආ) නිදහස් ව්‍යවසාය ආර්ථික ක්‍රමය සහ සැලසුම් ආර්ථික ක්‍රමය යන දෙකෙහිම සංකලනයක් ලෙස මිශ්‍ර ආර්ථිකය සැලකේ.
(ලකුණු 01)

කෙසේ නිපදවන්නේ ද යන ගැටලුව විසඳීමේ දී මිශ්‍ර ආර්ථිකයක සිටින පෞද්ගලික අංශය ස්වාර්ථය උපරිම වන අයුරින් අඩු පිරිවැය සහිත වඩාත් කාර්යක්ෂම ශිල්ප ක්‍රමය තෝරා ගනී. (ලකුණු 01)

රාජ්‍ය අංශය පොදු යහපත හා සුභසාධනය ඉහළ නංවාලමින් සැලසුම් සහගතව නිෂ්පාදන ශිල්ප ක්‍රමය තෝරා ගනිමින් නිෂ්පාදන කටයුතු සිදු කරයි. (ලකුණු.01)

02 වන ප්‍රශ්නය

(i) සැපයුම් නීතිය පැහැදිලි කර ඊට බලපාන හේතු සඳහන් කරන්න. (ලකුණු 04යි)

(ii) X නමැති භාණ්ඩයේ වෙළෙඳපොළ තොරතුරු පහත දැක්වේ.

ඒකකයක මිල (රු.)	ඉල්ලුම් ප්‍රමාණය (ඒකක)	අධි සැපයුම් ප්‍රමාණය (ඒකක)
10	180	-160
60	80	40

(අ) ඉහත භාණ්ඩයේ සමතුලිත මිල හා ප්‍රමාණය ප්‍රස්තාර සටහනකින් දක්වන්න. (ලකුණු 04යි)
(ආ) සමතුලිතයේ දී ආර්ථික අතිරික්තය ගණනය කරන්න. (ලකුණු 03යි)
(ඉ) සමතුලිත මිලෙහි දී ඉල්ලුම් නම්‍යතාව ගණනය කරන්න. (ලකුණු 02යි)
(iii) කිසියම් භාණ්ඩයක ඉල්ලුම අනම්‍ය වීමට බලපාන සාධක සඳහන් කරන්න. (ලකුණු 04යි)
(iv) වෙළෙඳපොළ සමතුලිතයක දැකිය හැකි ලක්ෂණ කවරේ ද? (ලකුණු 03යි)

02

(i) යම් දෙන ලද අවස්ථාවක භාණ්ඩයක සැපයුම තීරණය කරන අනෙකුත් සාධක ස්ථාවරව තිබියදී , සලකා බලන භාණ්ඩයේ මිලත් සැපයුම් ප්‍රමාණයක් අතර පවතින අනුලෝම සම්බන්ධතාව සැපයුම් නීතිය වේ. (ලකුණු 02)

එයට බලපාන හේතු වනුයේ,


නිෂ්පාදනයේ ආන්තික පිරිවැය ඉහළ යාම
- වැඩිවන ආවස්ථික පිරිවැය
- හීනවන ආන්තික ඵලදාව

නිෂ්පාදන ආයතනවල ලාභ අපේක්ෂාව (ලකුණු 02)

(ii) **(අ)**

ඒකකයක මිල	ඉල්ලුම් ප්‍රමාණය	සැපයුම් ප්‍රමාණය	අධි මිල	අධි සැපයුම
10	180	20	160	-160
60	80	120	-40	40

(ලකුණු 02)



(ලකුණු 02)

(ආ)

පාරිභෝගික අතිරික්තය = $\frac{(100-50)\text{X } 100}{2}$ = 2500

නිෂ්පාදන අතිරික්තය = $\frac{(50-0)\text{X } 100}{2}$ = 2500

ආර්ථික අතිරික්තය = පාරි: අති: + නිෂ්: අති:

= 2500 + 2500 = <u>5000</u> (ලකුණු 03)

<u>විකල්ප පිළිතුරු</u>

ආර්ථික අතිරික්තය = $\frac{(100-0)\times 100}{2} = \frac{10000}{2} =$ <u>2500</u>

(ඉ) මිල ඉල්ලුම් නම්‍යතාව $= \frac{\Delta Qd}{\Delta P} \times \frac{P}{Qd}$ ——————①

$= \frac{-100}{50} \times \frac{50}{100}$ ① ①

$=$ <u>-1</u>

III. පුළුල් නිර්වචනය
ආදේශන අඩුවීම
ආදායමෙන් වියදම් කරන ප්‍රමාණය අඩුවීම.
කාලය කෙටිවීම (ලකුණු 01× 4)

IV. එකඟ වේ

වෙළඳ පොළ සමතුලිතයේදී ඉල්ලුම් ප්‍රමාණය, සැපයුම් ප්‍රමාණයට සමාන වේ. ඒ අනුව ආන්තික ප්‍රතිලාභ ආන්තික පිරිවැයට සමාන වේ. (MB = MC) (ලකුණු 01)

සම්පත් බෙදී යාමේ කාර්යක්ෂමතාවට අවශ්‍ය වන ප්‍රධාන කොන්දේසිය ආන්තික පිරිවැයට ආන්තික ප්‍රතිලාභ සමාන වීමයි. එය වෙළෙඳපොල සමතුලිතයේදී ඉටුවන හෙයින් සමතුලිතයේ දී සම්පත් බෙදීයාම කාර්යක්ෂම වේ. (ලකුණු 01)

03 වන ප්‍රශ්නය

(i) තරහකාරී වෙළඳපොළක අලෙවි වන භාණ්ඩයක් සඳහා උපරිම මිලක් නියම කිරීමේ ආර්ථික ප්‍රතිවිපාක රූප සටහනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(ii) වෙළෙඳපොළෙ හි අලෙවි වන භාණ්ඩයක් සඳහා අවම මිල නියම කිරීම, සමාජ ශුභසාධනය කෙරෙහි කවර බලපෑමක් ඇති කරනු ලැබේ ද? රූප සටහනක් ආධාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(iii) කෘෂිකාර්මික භාණ්ඩවල මිල ස්ථාවර කිරීම සඳහා රජය යොදාගන්නා ක්‍රියාමාර්ග කවරේ ද? (ලකුණු 04යි)

(iv) කාර්මික භාණ්ඩයක ඉල්ලුම් හා සැපයුම් සමීකරණ පහත දැක්වේ.

Qd = 800 – 10P Qs = -200 + 10P

(අ) වෙළඳපොළ සමතුලිත මිල හා සමතුලිත ප්‍රමාණය කොපමණ ද? (ලකුණු 02යි)


(ආ) මෙම භාණ්ඩ ඒකකයක් සඳහා රජය විසින් රු. 10 ක බද්දක් නිෂ්පාදකයා මත පනවනු ලැබුව හොත් රජයට ලැබෙන බදු ආදායම කොපමණ ද ? (ලකුණු 02යි)

(ඉ) බදු පැනවීමෙන් පසු ආර්ථික අතිරික්තයේ වෙනස කොපමණ ද? (ලකුණු 02යි)

(ඊ) බදු පැනවීමෙන් පසු අහිමි වන ශුභසාධනයේ ප්‍රමාණය ගණනය කර දක්වන්න. (ලකුණු 02යි)

03

(i) පහත රූපයේ දැක්වෙන්නේ භාණ්ඩයක් අලෙවි කළ හැකි උපරිම මිල රජය විසින් නියම කිරීමකි.




(රූප සටහනට ලකුණු 01 යි.)

උපරිම මිල නියම කිරීමෙන් පසු වෙළෙඳපොළේ ඇතිවන ආර්ථික ප්‍රතිවිපාක පහත දැක්වේ.

- පාරිභෝගික අතිරික්තය වෙනස්වීම.
  (පෙර පාරිභෝගික අතිරික්තය a+b+c වේ.
  පසු පාරිභෝගික අතිරික්තය a+b+d වේ.)
- නිෂ්පාදන අතිරික්තය අඩුවීම.
  (පෙර නිෂ්පාදක අතිරික්තය def වේ.
  පසු නිෂ්පාදක අතිරික්තය f වේ.)
- ආර්ථික අතිරික්තය පහළ යාම (සමාජ ශුභ සාධනය පහළ යාම)
  පෙර ආර්ථික අතිරික්තය a+b+c+d+e+f
  පසු ආර්ථික අතිරික්තය a+b+d+f
- ශුභ සාධන පිරිවැයක් ඇතිවීම.
- $Q_1 - Q_2$ ඵාන නිෂ්පාදනය නිසා සම්පත් බෙදා වෙන් කිරීමේ අකාර්යක්ෂමතාවයක් ඇති වේ.
- ඵාන නිෂ්පාදනය නිසා සුභසාධන පිරිවැයක් - (c+e) ඇති වේ.

(කරුණු 3 කට ලකුණු 03 යි.)

(II) අවම මිල නියම කල අවස්ථාවක වෙළෙඳපොළ කෙරෙහි බලපෑම පහත රූප සටහනේ දැක්වේ.



(රූප සටහනට ලකුණු 01 යි.)

- අවම මිල නියම කිරීමෙන් අනතුරුව සමාජ ශුභ සාධනය පහළ යයි. එනම් ආර්ථික අතිරික්තය පහළ යයි.
- පෙර ආර්ථික අතිරික්තය a+b+c+d+e
  පෙර පාරිභෝගික අතිරික්තය a+b+c
  පෙර නිෂ්පාදන අතිරික්තය d+e
- පසු ආර්ථික අතිරික්තය a+b+ e
  පසු නිෂ්පාදක අතිරික්තය b+ e
  පසු පාරිභෝගික අතිරික්තය a
  ආර්ථික අතිරික්තය පහළ යාම c+d


(කරුණු 3 කට ලකුණු 03 යි.)

(III)

- කෘෂිකාර්මික භාණ්ඩවල අවම මිල රජය නියම කොට අතිරික්ත සැපයුම් ප්‍රමාණය රජය මිලදී ගැනීම.
- කෘෂිකාර්මික භාණ්ඩවලට රජය විසින් සහතික මිල ලබාදී ඌණ පූර්ණ ගෙවීම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම.
- කෘෂි නිෂ්පාදිත අපනයන කරන පුද්ගලයින් හට සහනාධාර ලබාදීම.
- කෘෂි නිෂ්පාදකයින් හට නිෂ්පාදන සලාක ලබාදීම.
- කෘෂි නිෂ්පාදන සඳහා රජය විසින් තොග රැස් කිරීම හා මුදා හැරීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- කෘෂි නිෂ්පාදන සඳහා වෙළෙඳපොළේ අනාගතයේ පවතින ඉල්ලුම් හා සැපයුම් තත්ත්වයන් කල් ඇතිව නිෂ්පාදකයින්ට ලබාදීම.
- කෘෂි වගාවන් සීමාසහිතව පවත්වාගෙන යාමට උපදෙස් දී නිෂ්පාදනයට යොදා නොගන්නා ඉඩම්වලට ගෙවීමක් කිරීම.

(කරුණු 4 කට ලකුණු 04යි.)

(IV)



(අ) සමතුලිත මිල

$$Qd = Qs$$

$$800 - 10p = -200 + 10p$$

$$\frac{1000}{20} = \frac{20P}{20}$$

$$\underline{50 = P}$$

$Qd = 800 - 10P$

$= 800 - 10 \times 50$

$= 800 - 500$

$Qd = \underline{300}$

සමතුලිත ප්‍රමාණය ඒකක ගණන = 300

සමතුලිත මිල = රු. 50

(අ) බද්දෙන් පසු සැපයුම් සමීකරණය

$Q_S = -200 + 10P$

$Q_{S1} = -200 + 10 (P-10)$

$Q_{S1} = -200 + 10P - 100$

$Q_{S1} = -300 + 10P$

රජයේ බදු ආදායම = 10×250

$\underline{\text{රු. } 2500}$

(ආ) බද්දෙන් පසු භාණ්ඩයේ මිල

$Q_d = Q_{S1}$

$800 - 10P = -300 + 10P$

$1100 = 20P$

$55 = P$

$Qd = 800 - 10p$

$Qd = 800 - 10 \times 55$

$Qd = 800 - 550$

$Qd = 250$

$Qd = 250$

(ඇ) බදු පැනවීමෙන් පසු ආර්ථික අතිරික්තය අඩුවීම.

බදු පැනවීමෙන් පසු ආර්ථික අතිරික්තය = බද්දෙන් පසු පාරිභෝගික අතිරික්තය + බද්දෙන් පසු නිෂ්පාදන අතිරික්තය + රජයේ බදු ආදායම

= 3125 +3125+2500

= 8750

බදු පැනවීම නිසා ආර්ථික අතිරික්තය අඩුවීම = බදු පැනවීමට පසු ආර්ථික අතිරික්තය - බදු පැනවීමට පෙර ආර්ථික අතිරික්තය

$= 8750 - 9000$

$\underline{= -250}$

(ඈ) බදු පැනවීම නිසා අහිමි වන ශුභ සාධනය = $\frac{1}{2} \times 10 \times 50$

= $\underline{250}$

04 වන ප්‍රශ්නය

(i) කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය හා දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිතය අර්ථ දක්වන්න. (ලකුණු 04යි)

(ii) කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ න්‍යාය කුමක් ද? එය අර්ථ දක්වන්න. (ලකුණු 02යි)

(iii) පහත සඳහන් අවස්ථා විචල්‍ය පිරිවැය ,ස්ථාවර පිරිවැය හෝ ගිලුණු පිරිවැය යන පිරිවැය ස්වරූපයන්ගෙන් කවරකට අයත් වේ දැ' යි සඳහන් කරන්න.

(අ) ලී බඩු නිෂ්පාදන ආයතනයක් රු.500,000 ක් වැය කර ලී කපන යන්ත්‍රයක් මිල දී ගැනීම.

(ආ) එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා රු.60,000 ක් වැය කර එය අවසන් කිරීමට පෙර අත්හැර යාම.

(ඉ) නිෂ්පාදන ආයතනයක් විසින් සේවකයින් හට දෛනික වැටුප් ගෙවීම.

(ඊ) නව සිසිල් බීම නිෂ්පාදන ආයතනයක් සඳහා බලපත්‍රයක් ලබා ගැනීම. (ලකුණු 01x4 = 04යි)

(iv) පූර්ණ තරඟකාරී ආයතනයක පිරිවැය ආශ්‍රිත දත්ත පහත දැක්වේ.

නිමැවුම (ඒකක)	1	2	3	4	5	6	7
මුළු පිරිවැය (රු.)	11	13	17	25	37	52	70

මෙම ආයතනය විසින් නිෂ්පාදනයය කරන භාණ්ඩ ඒකකයක මිල රු.8ක් වන්නේ නම්,

(අ) ආයතනයේ සාමාන්‍ය අයහාරය සහ ආන්තික අයහාරය කොපමණ ද? (ලකුණු 02යි)

(ආ) MR = MC ප්‍රවේශය මත ආයතනයේ ලාභ උපරිම කෙරෙන නිමවුම් මට්ටම කොපමණ ද? (ලකුණු 02යි)

(v) (අ) පූර්ණ තරගකාරී වෙළෙඳපාළක් සහ ඒකාධිකාරී තරග වෙළෙඳපොළක් අතර දක්නට ලැබෙන වෙනස්කම් **දෙකක්** පෙන්වා දෙන්න. (ලකුණු 02යි)

(ආ) සාධක වෙළෙඳපොළ තුල සියලුම ඉපයීම් සංක්‍රාම ඉපයීම් වලින් හා සියලුම ඉපයීම් ආර්ථික බදු කුළියෙන් පමණක් සමන්විත වන්නේ කවර තත්ත්වයක් යටතේ ද? යෝග්‍ය ප්‍රස්ථාර සටහන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

04

(i) නිෂ්පාදන ධාරිතාවය සහ තාක්ෂණය නොවෙනස් ව තිබිය දී විචල්‍ය යෙදවුම් පමණක් වෙනස් කරමින් නිෂ්පාදනයේ නිරත වන විට යෙදවුම් හා නිමැවුම් අතර පවත්නා තාක්ෂණික සම්බන්ධතාව කෙටි කාලීන නිෂ්පාදන ශ්‍රිතය ලෙස හැඳින්වේ.

$Q = f(L, \overline{K})$

$Q = f(L_1, L_2 \ldots\ldots L_n, K)$ (ලකුණු 02)

නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ සියළුම යෙදවුම් වෙනස් කරන විට යෙදවුම් සහ නිමැවුම් අතර පවතින තාක්ෂණික සම්බන්ධතාව දිගු කාලීන නිෂ්පාදන ශ්‍රිතය වේ.

$Q = f(L, K)$

$Q = f(L_1, L_2 \ldots\ldots L_n, K_1, K_2 \ldots\ldots K_n)$ (ලකුණු 02)

(II) කෙටි කාලීන නිෂෟපාදනය මෙහෙවෙන්නේ හීනවන ආන්තික ඵලදා නීතිය මතය . (ලකුණු 01)

නිෂ්පාදන ආයතනයක් කෙටි කාලයේ දී ස්ථාවර යෙදවුම් සමග මිශ්‍ර කරමින් විචල්‍ය යෙදවුම් පමණක් වැඩි කරන විට විචල්‍ය යෙදවුම් පමණක් වැඩි කරන විට, විචල්‍ය යෙදවුමේ ආන්තික ඵලදාව හා සාමාන්‍ය ඵලදාව එක්තරා අවස්ථාවකට පසුව පහළ යෑම හීනවන ආන්තික ඵලදා නීතිය නිමන් හැඳින්වේ. (ලකුණු 01)

(III) අ) - ස්ථාවර පිරිවැය

ආ) - ගිලුණු පිරිවැය

ඇ) - විචල්‍ය පිරිවැය


ඈ) - ස්ථාවර පිරිවැය (ලකුණු 04)

(IV) අ) සාමාන්‍ය අයහාරය සහ ආන්තික අයහාරය ද රුපියල් 8.කි (ලකුණු 02)


ආ) ලාභ උපරිම කෙරෙන නිමැවුම් මට්ටම 4 කි. (ලකුණු 01)

(V)

MR = MC ප්‍රවේශය



TR = TC ප්‍රවේශය



(කුමන හෝ ප්‍රවේශයකට ලකුණු 02) පැහැදිලි කිරීමක් අවශ්‍ය නොවේ. ප්‍රස්තාරය පමණක් ප්‍රමාණවත්

05 වන ප්‍රශ්නය

(i) ජාතික ගිණුම්කරණය හා සම්බන්ධ නිමැවුමේ දළ වටිනාකම, අතරමැදි යෙදවුම් හා ප්‍රාථමික යෙදවුම් යන සංකල්ප හඳුන්වන්න. (ලකුණු 03යි)

(ii) පහත දැක්වෙන ආර්ථික ක්‍රියාකාරකම් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම සඳහා ඇතුළත් කරන්නේ ද? නැද්ද? ඔබේ පිළිතුර හේතු සහිත ව දක්වන්න.

(අ) ගෘහ සෙවිකාවන් වැටුප් ලබමින් ආහාර පිසීම.

(ආ) වාණිජ බැංකුවක් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය පහසුකම් ලබා ගැනීම.

(ඉ) මූල්‍ය ආයතනයක් ණය සැපයීම මගින් පොළී ආදායම් උපයා ගැනීම.

(ඊ) පාසැල් ගුරුවරියක් තම දරුවාට නිවසේ දී පාඩම් ඉගැන්වීම. (ලකුණු 01x4 = 04යි)

(iii) කල්පිත ආර්ථිකයක් සම්බන්ධයෙන් 2025 වර්ෂයට අදාළව පහත තොරතුරු ඔබට සපයා ඇත.

(සියලුම සංඛ්‍යා රුපියල් මිලියන වලිනි)

සේවක ඉපයීම්	3300	නිෂ්පාදනය මත අනෙකුත් ශුද්ධ බදු	150
ශුද්ධ මෙහෙයුම් අතිරික්තය	6000	විදේශ ප්‍රාථමික ආදායම් ගෙවීම්	470
කුටුම්භ අංශයේ අවසන් පරිභෝජනය	8000	ගෙවුම්තුලනයේ ද්විතියික ආදායම් ගිණුමේ ශේෂය	1200
ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය	800	දළ මිශ්‍ර ආදායම්	750
විදේශ ප්‍රාථමික ආදායම් ලැබීම්	180	භාණ්ඩ හා සේවා මත (ශුද්ධ) බදු	500
රාජ්‍ය අංශයේ අවසන් පරිභෝජනය	1000	දළ ප්‍රග්ධන සම්පාදනය	3700

ඉහත තොරතුරු ඇසුරින් පහත දෑ ගණනය කරන්න.

(අ) මූලික මිල මත සමස්ත එකතු කළ අගය.

(ආ) වෙළඳ මිල මත දළ දේශීය නිෂ්පාදිතය.

(ඉ) දළ ජාතික ආදායම.

(ඊ) වැය කළ හැකි ජාතික ආදායම.

(උ) ජාතික ඉතුරුම් (ලකුණු 01x5 = 05යි)

(iv) සමාහාර ඉල්ලුම නිර්වචනය කරන්න. (ලකුණු 02යි)

(v) කිසියම් ආර්ථිකයක සාර්ව ආර්ථික ක්‍රියාකාරිත්වයට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

(සියලුම සංඛ්‍යා රු. බිලියන වලිනි)

ඉතුරුම් ශ්‍රිතය (S) = $- 500 + 0.4Y_d$ බදු (T) = 340

සංක්‍රාම (TR) = 40 ආනයන (M) = 160

මුළු විදීම් (J) = 540

(අ) සමතුලිත ජාතික ආදායම් මට්ටම ගණනය කරන්න. (ලකුණු 02යි)

(ආ) මෙම ආර්ථිකයේ රජයේ මිල දී ගැනීම් හා රජයේ සංක්‍රාම වියදම් සමාන ප්‍රමාණයකින් ඉහළ නැංවීම සමතුලිත ජාතික ආදායම් මට්ටම කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න (ලකුණු 04යි)

05

(i) නිෂ්පාදන ක්‍රියාවලිය මඟින් බිහිවන භාණ්ඩ හා සේවාවල මූල්‍යමය වටිනාකම නිමැවුමේ දළ වටිනාකම යන්නෙන් අදහස් වේ. ඒ තුළ නිෂපාදකයන් විසන් අලුතින් ජනනය කළ වටිනාකම (එකතුකළ අගය) පමණක් නොව, පිටතින් මිලදීගත් අතරමැද යෙදවුම්වල වටිනාකමද ඇතුළත් වේ. (ලකුණු 01)
අතරමැදි යෙදවුම් යනු එක් එක් ආයතනය විසින් තම නිමවුම් බිහි කිරීම සඳහා වෙනත් ආයතනවලින් මිලදීගත් යෙදවුම් වේ.
උදා - අමු ද්‍රව්‍ය , ලිපිද්‍රව්‍ය (ලකුණු 01)
නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගැනෙන භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය යනාදි නිෂ්පාදන සාධක ප්‍රාථමික යෙදවුම් වේ. මේවා එකතු කළ අගයන් ජනනය කෙරෙන යෙදවුම් ලෙස හැඳින්වේ. (ලකුණු 01)

(ii) **(අ)** ඇතුළත් කරයි.
(ආ) ඇතුළත් නොකරයි.
(ඉ) ඇතුළත් කරයි.
(ඊ) ඇතුළත් නොකරයි. (ලකුණු 04)

(iii) **(අ)**

මූලික මිල මත සමස්ත එකතු කළ අගය = සේවක ආදායම් + ශුද්ධ මෙහෙයුම් අතිරික්තය + දළ මිශ්‍ර ආදායම් + ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය + නිෂ්පාදනය මත අනෙකුත් (ශුද්ධ) බදු

= 3300 + 6000 + 750 + 800 + 150

= <u>රු.මි. 11000</u> (ලකුණු 01)

(ආ)

වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය = මූලික මිලට සමස්ත දළ එකතුකළ අගය + භාණ්ඩ හා සේවාමත (ශුද්ධ) බදු

= 11000 + 500

= <u>රු.මි. 11500</u> (ලකුණු 01)

(ඉ)

දළ ජාතික ආදායම = වෙළෙඳපොළට දළ දේශීය නිෂ්පාදිතය + ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම

= 11500 + (180 - 470)

= රු.මි. 11210 (ලකුණු 01)

(ඊ)

වැයකළ හැකි දළ ජාතික ආදායම = දළ ජාතික ආදායම + ගෙවුම් තුලනයේ ද්විධිතික ආදායම් ගිණුම් ශේෂය

= 11210 + 1200

= <u>රු.මි. 12410</u> (ලකුණු 01)

(උ)

ජාතික ඉතුරුම් = වැයකළ හැකි දළ ජාතික ආදායම - (කුටුම්භ පරිභෝජනය + රජයේ පරිභෝජන)

= 12410 – (8000 + 1000)

= රු.මි. 3410 (ලකුණු 01)

(iv) **(අ)** සමාහාර ඉල්ලුම යනු යම් දෙන ලද කාලපරිච්ඡේදයක් තුළ ආර්ථිකයේ විවිධ ක්‍රියාකාරකයන් භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා වැය කිරීමට සැලසුම් කර ඇති වියදම් ප්‍රවාහයයි.
E = C + I + G + NX (ලකුණු 02)

(ආ) (a) W = J
S+NT+M = J
-500+0.4Yd+ (340-40) +160 = 540
580 = 0.4Y-120
$Y = \frac{700}{0.4}$
Y = 1750 (ලකුණු 02)

(b) රාජ්‍ය වියදම් ඉහළ යාම රාජ්‍ය වියදම් ගුණකය මඟින් නිරූපණය වේ.

$K_G = \frac{1}{1-b} = \frac{1}{1-0.4} = 2.5$ (ලකුණු 01)

සංක්‍රාම ඉහළ යාමේ ගුණක ප්‍රතිවිපාකය සංක්‍රාම ගුණකය මඟින් නිරූපණය කෙරේ.

$k_{Tr} = \frac{b}{1-b} = \frac{0.6}{0.4} = 1.5$ (ලකුණු 01)

රාජ්‍ය වියදම් ගුණකය , සංක්‍රාම ගුණකයට වඩා ඉහළ අගයක් ගනී. රාජ්‍ය වියදම් සෘජුවම සමාහාර ඉල්ලුම කෙරෙහිත්, එමගින් ජාතික ආදායමටත්බලපාන නමුත්, සංක්‍රාම ජාතික ආදායමට බලපානුයේ වක්‍රවය. එනම් සංක්‍රාම වැඩිවන විට මුලින්ම වැයකළ හැකි ආදායම වැඩිවීම. ආන්තික පරිභෝජන නැමියාවේ ගුණිතයකින් සමාහාර ඉල්ලුමටත් ජාතික ආදායමටත් බලපෑම මෙයට හේතුවයි. (ලකුණු 02)

"ආ" උප කොටස

(මෙම කොටසෙන් අවම වශයෙන් **ප්‍රශ්න දෙකක්** තෝරා ගන්න.)

06 වන ප්‍රශ්නය	
(i) (අ) මහජනතාව මුදල් ඉල්ලුම් කරන්නේ ඇයි?	(ලකුණු 03යි)
(ආ) මූර්ත ආදායමත් මුදල් ඉල්ලුමත් අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරන්න.	(ලකුණු 03යි)
(ii) M_4 මූල්‍ය සමාහාරය තුළ ඇතුළත් සංරචක සඳහන් කරන්න.	(ලකුණු 04යි)
(III) (අ) ආර්ථිකයක පවතින උද්ධමනකාරී තත්ත්වය එම ආර්ථිකයේ ආයෝජන සහ ඉතුරුම් වලට බලපාන ආකාරය පැහැදිලි කරන්න.	(ලකුණු 04යි)
(ආ) නිෂ්පාදකයාගේ මිල දර්ශකයේ ප්‍රායෝගික වැදගත්කම් **දෙකක්** සඳහන් කරන්න.	(ලකුණු 02යි)
(IV) එක් දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය යනු කුමක්ද? මෙය ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.	(ලකුණු 04යි)

06

(i) **(අ)** ගනුදෙනු චේතනාව
ආරක්ෂණ චේතනාව
සමපේක්ෂණ චේතනාව (ලකුණු 03)

(ආ) ගනුදෙනු චේතනාව මත මුදල් ඉල්ලුම හා ආරක්ෂණ චේතනාව මත මුදල් ඉල්ලුම තීරණය කරන ප්‍රධාන සාධකය පාරිභෝගික මූර්ත ආදායමයි.
පාරිභෝගික මූර්ත ආදායමක් ගනුදෙනු චේතනාව හා ආරක්ෂණ චේතනාව මත මුදල් ඉල්ලුම අතර පවතින්නේ ධන සම්බන්ධයකි.
පාරිභෝගික මූර්ත ආදායම වැඩිවන විට ආරක්ෂණ හා ගනුදෙනු චේතනාව මත මුදල් ඉල්ලුම ඉහළ යන අතර පාරිභෝගික මූර්ත ආදායම අඩුවන විට ආරක්ෂණ හා ගනුදෙනු චේතනාව මත මුදල් ඉල්ලුම අඩු වේ. (ලකුණු 02)

(ii) ඉතා පුළුල් මුදල් සැපයුමට අදාළ සංරචක වන්නේ,

- මහජනතාව සතු ව්‍යවහාර මුදල්
- මහජනයා සතු වාණිජ බැංකු වෙතැති ඉල්ලුම් තැන්පතු
- මහජනයා සතු වාණිජ බැංකු සතු කාලීන හා ඉතුරුම් තැන්පතු
- ගලපන ලද විදේශ ව්‍යවහාර මුදල් තැන්පතු
- මහජනයා සතු බලපත්‍රලාභී විශේෂිත බැංකුවල කාලීන හා ඉතුරුම් තැන්පතු
- ලියාපදිංචි කළ මූල්‍ය සමාගම්වල මහජනයා සතු කාලීන හා ඉතුරුම් තැන්පතු (ලකුණු 04)

(අ) උද්ධමනකාරී තත්ත්වයේදී මිල ගනන් ඉහළ යන්ම, ඉතුරුම්වල මූර්ත අගය පිරිහීමකට ලක් වේ.
එසේම උද්ධමනයකදී මූර්ත පොලී නඅනුපාතය පහළ යන හෙයින් ඉතුරුම් අධෛර්යමත් වේ.
උද්ධමන වේගයට සාපේක්ෂව තම ආදායම් වැඩි කරගත නොහැකි කොටස්වල ඉතුරුම් හැකියාව පහත වැටේ.
එමෙන්ම භාණ්ඩ හෝ ද්‍රව්‍යමය වත්කමේ (ඉඩම්, නිවාස) හෙවත් මූර්ත ඉතුරුම් ඉහළ යයි.
උද්ධමනයකදී ඉතුරුම් අධෛර්යමත් වීමෙන් ආයෝජනයට අවශ්‍ය සම්පත් හිඟ වීම නිසා ආයෝජන පිරිවැය (පොළී අනුපාතය) ඉහළ යයි.
එමෙන්ම ආයෝජකයන්ගේ අවධානම හා අවිනිශ්චිත බව ඉහළ යාම නිසා. දිගු කාලීන ආයෝජන ධෛර්යමත් වේ. ඒ තුලින් ආර්ථික වෘද්ධිය අඩාල වේ.

(ආ) උද්ධනම පිඩන කල් ඇතිව හඳුනාගත හැකිවීම.
ප්‍රතිපත්ති සම්පාදනයට ප්‍රයෝජනවත් වීම.
අවධමනකයක් ලෙස භාවිතා කිරිම.
- ශ්‍රම ඵලදාව මැනිමට යොදාගත හැකිවීම.
- ආයෝජන තීරණ ගැනීමට උදව් වීම. (ලකුණු 02)

(iii) එක්දින ප්‍රතිපත්ති පොළි අනුපාතය යනු තනි ප්‍රතිපත්ති පොළි අනුපාත ක්‍රමවේද යටතේ පවතින, මහ බැංකුවේ ප්‍රතිපත්ති පොළී අනුපාතයයි. (ලකුණු 02)

<u>වාසි</u>
මූල්‍ය ප්‍රතිපත්තීන් කාර්යක්ෂම හා සැලකිය යුතු ඉහළ යාම.
මූල්‍ය වෙළෙඳපොළට පැහැදිලි හා ස්ථාවර සංඥා ලබාදීම.
මූල්‍ය ප්‍රතිපත්ති දිශානතිය පිළිබඳ ඇතිවිය හැකි අවිනිශ්චිතතා ඉවත් වීම.
වෙළෙඳපොළ සහභාගිවන්නන්ට වැඩි විශ්වාසයකින් යුක්තව දැනුවත් තිරණ ගැනීමට හැකිවීම. (ලකුණු 02)

07 වන ප්‍රශ්නය

(i) වෙළෙඳපොළ අසමත්වීම, පැහැදිලි කර ඊට බලපාන හේතු සඳහන් කරන්න. (ලකුණු 04යි)

(II) ඍණ බාහිරතා සහිත පාරිභෝජන ක්‍රියා සම්බන්ධයෙන් වෙළෙඳපොළ තුළ ඌන පරිභෝජනක් ඇති වේ ද? අධි පරිභෝජනයක් ඇති වේ ද? සුදුසු රූප සටහනක් ඇසුරෙන් පිළිතුරු පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(III) ව්‍යවස්ථාපිත බදු ආපාතය හා ආර්ථික බදු ආපාතය යන සංකල්ප පැහැදිලි කර, එම බදු ආපාත අතර වෙනසක් ඇතිවන්නේ කෙසේදැ'යි පෙන්වා දෙන්න. (ලකුණු 04යි)

(IV) ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුදය, රාජ්‍ය මූල්‍ය නිර්ණායක ඇසුරෙන් අනාවරණය වන්නේ කෙසේද? පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

(V) කල්පිත ආර්ථිකයක රාජ්‍ය මූල්‍ය පිළිබඳ තොරතුරු පහත දැක්වේ. (සියලුම සංඛ්‍යා රුපියල් බිලියන වලිනි)

බදු ආදායම	3700	බදු නොවන ආදායම	200
ප්‍රදාන	150	පුනරාවර්තන වියදම	4300
ණය පොලී ගෙවීම්	1900	ප්‍රාග්ධන වියදම	600
ශුද්ධ ණය දීම්	100	ණය ආපසු ගෙවීම්	1400

ඉහත සංඛ්‍යා ඇසුරෙන් පහත දෑ ගණනය කරන්න.
(අ) වර්තන ගිණුමේ ශේෂය
(ආ) ප්‍රාථමික ශේෂය
(ඉ) සමස්ත අයවැය ශේෂය
(ඊ) දළ මූල්‍යයන අවශ්‍යතාව (ලකුණු 01x4 = 04යි)

07

(i) වෙළෙඳපොළ අසමත් වීම යනු සමාජයේ ශුභ සාධනය පිනිස සම්පත් කාර්යක්ෂමතාව ලෙස බෙදා වෙන් කිරීමට වෙළෙඳපොළ යාන්ත්‍රණය අපොහොසත් වීමය. වෙළෙඳපොළ අසමත් වීම් හට ගන්නේ පහත දැක්වෙන හේතු නිසාය. (ලකුණු 02)

- සම්පත් බෙදා වෙන්කිරීමේ අකාර්යක්ෂමතාවය
  - -පොදු භාණ්ඩ නොසැපයීම
  - -බාහිරතා පැවතීම
  - -අපූර්ණ කොරතුරු පැවතීම
  - -අපූර්ණ තරඟය
  - -සුභසාධන භාණ්ඩ ඌන නිෂ්පාදනය
  - -අවගුණ භාණ්ඩ අධි නිෂ්පාදනය
  - -අර්ධ පොදු භාණ්ඩ ඌන නිෂ්පාදනය
  - -නිෂ්පාදන සාධක අසංචලතාවය
  - -පොදු සම්පත් අධි උපයෝජනය
- ආදායම් බෙදීයාමේ විෂමතාවය
- සාර්ව ආර්ථික අස්ථායිතාවය (ප්‍රධාන කරුණු 03 ට ලකුණු 02 යි.)

(ii) සෘණ බාහිරතා පවතින පරිභෝජන ක්‍රියාකාරකම් හේතුකොට ගෙන වෙළෙඳපොළ තුල ඌන පරිභෝජන ඌන නිෂ්පාදන ඇතිවේ. (ලකුණු 01)

යම් පරිභෝජනයක් සම්බන්ධව බාහිර පාර්ශ්වයන් පිරිවැයක් දරන්නේ නම් එම බාහිර පිරිවැය පරිභෝජනයේ පෞද්ගලික ප්‍රතිලාභ සමග ගැලපූ විට පරිභෝජනයේ සමාජ ආන්තික ප්‍රතිලාභ පෞද්ගලික ආන්තික ප්‍රතිලාභ වලට පහළ යයි. එවිට වෙළෙඳපොළ තුල අධි පරිභෝජන අධි නිෂ්පාදන ඇතිවේ. (ලකුණු 01)

(iii) ව්‍යස්ථාපිත බදු ආපාතය යනු බදු නීතිය ප්‍රකාරව බදු ගෙවන මොහොතේදී බදු ගෙවන තැනැත්තාට මූල්‍යමය වශයෙන් දරන්නට වන බදු බරය. උදාහරණ ලෙස දුම් වැටියක් නිපදවන සමාගම දුම් වැටියට රු.100 ක බද්දක් ගෙවන්නේ නම් ඔහුට එම මොහොතේදී මුදල්මය වශයෙන් රු.100 ක බදු බරක් දැරීමට වේ. එය ව්‍යස්ථාපිත බදු ආපාතය වේ. (ලකුණු 01)

බදු විතැන්කිරීමේ ක්‍රියාවලිය ඔස්සේ ව්‍යස්ථාපිත බදු ආපාතයන් යම් ප්‍රමාණයක් ඉදිරිපසට හෝ පසුපසට විතැන් කල පසු බදු ගෙවන්නා හට මූර්තමය වශයෙන් දැරීමට සිදුවන බදු බර ආර්ථික බදු ආපාතය වේ. නිෂ්පාදකයා රජයට ගෙවූ රු.100 ක බද්දෙන් රු.60 ක් ගැනුම්කරු වෙත විතැන් කලේ නම් සැබැවින්ම නිෂ්පාදකයාට දරන්නට වන රු.40 ක සැබෑ බදු බර ආර්ථික බදු ආපාතය වේ. (ලකුණු 01)

- ව්‍යස්ථාපිත බදු ආපාතය සහ ආර්ථික බදු ආපාතය අතර වෙනසක් හට ගන්නේ බදු විතැන් කිරීමේ ක්‍රියාවලිය නිසාය. බදු විතැන්කිරීමේ ක්‍රියාවලිය නිසාය.බදු විතැන් කිරීමේ ප්‍රමාණය කෙරෙහි එම භාණ්ඩයට පවතින ඉල්ලුමේ සහ සැපයුමේ නම්‍යතාව ඉවහල් වනු ඇත.නිදසුනක් ලෙස පූර්ණ අනම්‍ය ඉල්ලුමක් පවතින භාණ්ඩයක් මත නිෂ්පාදකයා ව්‍යස්ථාපිත බදු ආපාතයක් දැරුවාට ඔහුට දැරීමට සිදුවන ආර්ථික බදු ආපාතය ශූන්‍ය වේ. (ලකුණු 01)

(IV) ශ්‍රී ලංකාවේ ආර්ථික අර්බුධය පැතිකඩ කීපයක් ඔස්සේ ආර්ථිකය මත ප්‍රක්ෂේපණය විය. ඒ පහත ආකාරයටය.

- අයවැය පරතරය ඉහළ යාම.
- රාජ්‍ය ණය ඉහළ යාම
- රාජ්‍ය ණය මූල්‍ය සඳහා ආර්ථිකය වෙත විභවතාවක් නොමැති වීම.
- ගෙවුම් ශේෂ හිඟය ඉහළ යාම.
- විදේශ වත්කම් සීඝ්‍රයෙන් පහළ යාම.
- මුදලේ විෂය අගය නම්‍ය වීම.
- දැරිය නොහැකි උද්ධමනය
- විරැකියාව සීඝ්‍රයෙන් වර්ධනය හා දරිද්‍රතාවය වර්ධනය වීම. (ලකුණු 01)

- පසුගිය වසර කීපය තුල ශ්‍රී ලංකාවේ වර්ධනය වූ ආර්ථික අර්බුධය රාජ්‍ය මූල්‍ය නිර්ණායක මඟින් ආර්ථිකය වෙත අනාවරණය වූයේ පහත පරිදිය.
- රාජ්‍ය අයවැය හිඟය සීඝ්‍රයෙන් වර්ධනය වීම.

වර්ෂය	වර්තන ගිණුමේ ශේෂය ද.දේ.නි %	ප්‍රාග්ධන ගිණුමේ ශේෂය ද.දේ.නි %	සමස්ථ අයවැය ශේෂය ද.දේ.නි %
2020	7.5	4.4	10.7
2021	7.3	5.7	11.7
2022	6.4	3.7	10.2
2023	6.0	0.6	3.2

(ලකුණු 01)

- රාජ්‍ය ණය සීඝ්‍රයෙන් ඉහළ නැඟීම.

වර්ෂය	රාජ්‍ය ණය ද.දේ.නි % ලෙස
2020	96.6
2021	100.0
2022	114.2
2023	104.7

(ලකුණු 01)

- රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම් ඉහළ යාම.

වර්ෂය	රාජ්‍ය ණය සේවා ගෙවීම් ද.දේ.නි % ලෙස	රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම් රාජ්‍ය ආදායමේ % ලෙස	රාජ්‍ය ණය ගෙවීම් රාජ්‍ය වියදමේ % ලෙස
2020	12.4	141.9	85.2
2021	13.5	163.4	109.4

2022	12.5	151.5	126.8
2023	15.4	139.8	124.4

(මෙහි සංඛ්‍යා අත්‍යාවශ්‍ය නොවේ.) (ලකුණු 01)

(V). අ) වර්තන ගිණුමේ ශේෂය=රජයේ මුළු ආදායම-රජයේ පුනරාවර්තන වියදම්

= 3900 - 4300

= -400

ආ) .ප්‍රාථමික ගිණුමේ ශේෂය= රාජ්‍ය ආදායම-රාජ්‍ය ණය පොලී ගෙවීම් හැර අනෙකුත් රාජ්‍ය වියදම්

= 4050 - (2400+600+100)

ඉ) සමස්ත අයවැය ශේෂය = 950

= ප්‍රදාන ඇතුලත් රජයේ ආදායම - රජයේ පුනරාවර්තන වියදම්,ප්‍රාග්ධන වියදම් හා ශුද්ධ ණය දීම්

= 4050 –(4300+600+100

= - 950

ඊ) දළ මූල්‍යන අවශ්‍යතාව = සමස්ත අයවැය හිඟය රාජ්‍ය ණය ආපසු ගෙවීම්

= 950

= 2350 (ලකුණු 01 බැගින් උපරිම 4 යි.)

08 වන ප්‍රශ්නය

(i) රෙදි හා සීනි යන භාණ්ඩ දෙක සම්බන්ධයෙන් X හා Y යන රටවල් දෙකෙහි ශ්‍රමිකයකුගේ සාමාන්‍ය ඵලදාව පහත ලේඛනයේ දැක්වේ.

රට	රෙදි (මීටර්)	සීනි (කිලෝ ග්‍රෑම්)
X	10	06
Y	04	06

(අ) ඒ ඒ රටට සාපේක්ෂ වාසි ඇත්තේ කුමන භාණ්ඩ සම්බන්ධයෙන් ද? (ලකුණු 02යි)

(ආ) රටවල් දෙකෙහි ම ශ්‍රමිකයන් දහස (1000) බැගින් සිටි යැයි ද, විශේෂීකරණයට පෙර එක් එක් කර්මාන්තයන් හි ශ්‍රමිකයන් 500 බැගින් සේවා නියුක්තව සිටියේ යැයි ද සිතන්න. සාපේක්ෂ වාසිය මත පදනම් වූ විශේෂීකරණය නිසා ගෝලීය නිෂ්පාදනය වෙනස් වී ඇති ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 02යි)

(ඉ) X හා Y දෙරට අතර අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වෙළෙඳාමක් හට ගැනීමට නම් , මෙම භාණ්ඩ හුවමාරු විය යුත්තේ කවර අනුපාතයකට ද? (ලකුණු 02යි)

(II) ආරක්ෂණවාදයට එරෙහි ව ඉදිරිපත් වන තර්ක කවරේද? (ලකුණු 04යි)

(III) ද්විත්ව සටහන් මූලධර්මයට අනුකූල ව පහත සඳහන් ගනුදෙනු ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ ලේඛනයෙහි වාර්තා කරන්නේ කෙසේද?

(අ) කටාර් රාජ්‍යයෙහි සේවය කරන ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවක්, ඩොලර් 200 ක මුදලක් ලංකාවේ සිටින තම මව්පියන් වෙත එවීම.

(ආ) සංචාරක ඉපයීම් ලෙස ශ්‍රී ලංකාවට ඩොලර් මිලියන 1136 ක ආදායමක් ලැබීම.

(ඉ) ශ්‍රී ලංකාවට චීන රජයෙන් රු.බි. 500 ක ණය මුදලක් ලැබීම.

(ඊ) ඇමරිකානු රජයෙන් ශ්‍රී ලංකා රජයට ඩො.මි.400 ක් වටිනා ගුවන්යානා පරිත්‍යාගයක් ලැබීම. (ලකුණු 01x4 = 04යි)

(IV) (අ) විනිමය අනුපාතිකය අවප්‍රමාණය කිරීම හා ක්ෂයවීම අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 02යි)

(ආ) "විනිමය අනුපාතිකය අවප්‍රමාණය කළ පමණින් එහි අපේක්ෂිත අරමුණු ඉටු නොවේ" මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04යි)

08

(i)

	රෙදි මීටරයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය	සීනි කිලෝවක් නිපදවීමේ ආවස්ථික පිරිවැය
X රට	$\frac{6}{10} = \mathbf{0.6}$	$\frac{10}{6} = 1.6$

Y රට	$\frac{6}{4} = 1.5$	$\frac{4}{6} = \mathbf{0.6}$

(අ)

- රෙදි ඒකකයක් නිපදවීමේ සාපේක්ෂ වාසි ඇත්තේ X රටට ය. හේතුව Y රටට සාපේක්ෂ X රට තුල රෙදි ඒකකයක් නිපදවීමේ සාපේක්ෂ පිරිවැය අඩුවීම. (ලකුණු 01 යි)
- සීනි ඒකකයක් නිපදවීමේ සාපේක්ෂ වාසි ඇත්තේ Y රටට ය. හේතුව X රටට සාපේක්ෂ Y රට තුල සීනි ඒකකයක් නිපදවීමේ ආවස්ථික පිරිවැය අඩුවීම. (ලකුණු 01 යි)

(ආ)

විශේෂිකරණයට පෙර ගෝලීය නිෂ්පාදනය

	X රටේ නිමැවුම	Y රටේ නිමැවුම	ගෝලීය නිමැවුම
රෙදි ඒකක	500 × 10 = 5000	500 × 4 = 2000	7000
සීනි ඒකක	500 × 6 = 3000	500 × 6 = 3000	6000
			13000

(ලකුණු 01 යි)

විශේෂිකරණයට පසු ගෝලීය නිෂ්පාදනය

	X රටේ නිමැවුම	Y රටේ නිමැවුම	ගෝලීය නිමැවුම
රෙදි ඒකක	1000×10=10000	0	10000
සීනි ඒකක	0	1000×6=6000	6000
			16000

(ලකුණු 01 යි)

- විශේෂිකරණයෙන් පසු ගෝලීය නිමැවුම ඒකක 3000 කින් ඉහළ යයි.

	වෙළඳාමට පෙර නිෂ්පාදනය	වෙළෙඳාමට පසු නිෂ්පාදනය	වැඩිවීම
රෙදි	(5000+2000) = 7000	10000	3000
සීනි	(2500+4000) = 6500	8000	1500

(ඉ) අන්‍යෝන්‍ය වාසිදායක හුවමාරු අනුපාතිකය

- X රට Y රටට රෙදි ඒකකයක් ආනයනය කරන විට සීනි ඒකක 0.6 ත් 1.5 ත් අතර ප්‍රමාණයක් ආනයනය කළ යුතුය.

$0.65 \leq 1C \leq 1.55$ (ලකුණු 01 යි)

- Y රට X රටට සීනි ඒකකයක් අපනයනය කරන විට රෙදි ඒකක 0.6 ත් 106 ත් අතර ප්‍රමාණයක් ආනයනය කළ යුතුය.

$0.6C \leq 1S \leq 1.6C$ (ලකුණු 01 යි)

(ii) **(අ)** මූල්‍ය ගිණුමේ මුදල් හා තැන්පතු හර ඩොලර් මි. 200
ජංගම ගිණුමේ ...?..... ආදායම් ගිණුම බැර ඩොලර් මි.200

(ආ) මූල්‍ය ගිණුමේ මුදල් හා තැන්පතු හර ඩොලර් මි. 1136
ජංගම ගිණුමේ සේවා ගිණුම බැර ඩොලර් මි.1136

(ඉ) මූල්‍ය ගිණුමේ මුදල් හා තැන්පතු හර ඩොලර් මි. 500
අනෙකුත් ආයෝජන බැර ඩොලර් මි.500

(ඊ) භාණ්ඩ ගිණුම හර ඩොලර් මි. 400

ප්‍රාග්ධන ගිණුම බැර ඩොලර් මි.400 (ලකුණු 04)

(iii) **(අ)** ස්ථාවර විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ රුපියලේ සම අගය මූල්‍ය අධිකාරිය විසින් පහළ දැමීම අවප්‍රමාණය කිරීමක් ලෙස සලකනු ලැබේ. (ලකුණු 01)

නම්‍ය විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ රුපියලේ අගය පහළ වැටීම විනිමය අනුපාතිකය ක්ෂයවීමක් ලෙස සලකනු ලැබේ. (ලකුණු 01)

(iv) විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම වඩාත් අර්ථවත් වන්නේ පහත කොන්දේසිය ද තෘප්ත වනවිටදි ය.

- අපනයන ඉල්ලුම නම්‍යවීම.
- ආනයන ඉල්ලුම නම්‍යවීම.
- අපනයන හා ආනයන නම්‍ය .....ඒකාබද්ධ මිල නම්‍යතාව 1 ට වැඩි විය යුතුවීම. (මාර්ෂල් - ලර්නර් කොන්දේසිය)
- අපනයන සැපයුම නම්‍යවීම.
- දේශීය මිල උද්ධමනය වළකාගත යුතුය.
- ආනයන ආදේශන කර්මාන්ත රට තුළ පැවතීම.
- තරඟකාරී වෙනත් රටවල් මුදල් අවප්‍රමාණය නොකළ යුතුවීම. (ඕනෑම කරුණු 4 කට ලකුණු 04)

(v) දේශීය නිෂ්පාදකයින් තම නිෂ්පාදනවල ගුණාත්මකභාවය හා කාර්යක්ෂමතාව වර්ධනය කර ගැනීමට උත්සුක නොවීම.
පාරිභෝගිකයාට ඉහළ මිලක් ගෙවීමට සිදුවීම.
යම් මොහොතක ආරක්ෂණය ඉවත කළ විට ආර්ථික ප්‍රශ්න උද්ගතවිය හැකිවීම.
ආරක්ෂණය දිගින් දිගටම බලාපොරොත්තුවීමෙන් රටට ස්ථීර අවශ්‍යතාවයක් බවට පත්වීම.
දේශීය වෙළෙඳපොලේ ඒකාධිකාරියක් ගොඩනැගීම.
දියුණු තාක්ෂණය සංක්‍රමණය නොවීම.
අලුත් අදහස් සහ සංකල්ප ගෝලීය වශයෙන් ව්‍යාප්තවීම සීමාවීම.

09 වන ප්‍රශ්නය
9. (i) "කිසියම් රටක් සංවර්ධනය කරා ගමන් කිරීමේ දී ආර්ථික වර්ධනය අත්‍යවශ්‍ය සාධකයක් වුව ද එය පමණක් ප්‍රමාණවත් නොවේ" මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න. (ලකුණු 04) (ii) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දී ඇති තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකර ගැනීමට යාමේ දී රටවල් මුහුණ දෙන අභියෝග කවරේ ද? (ලකුණු 04) (iii) නිරපේක්ෂ දරිද්‍රතාව සහ සාපේක්ෂ දරිද්‍රතාව යන සංකල්ප අතර වෙනස දක්වා , නිරපේක්ෂ දරිද්‍රතාව මැනීමට උපයෝගි කර ගන්නා මිනුම් සඳහන් කරන්න. (ලකුණු 04) (iv) ශ්‍රී ලංකා මහ බැංකු දත්තවලට අනුව 2024 /2025 වසරවල ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධන අනුපාතිකය 5% කි. එහෙත් ශ්‍රී ලංකාවේ ආදායම් බෙදී යාමේ විෂමතාවයක් පවතී. ආර්ථික වර්ධනය අත්පත් කර ගන්නවාත් සමඟ ම ආදායම් බෙදී යාමේ විෂමතාව අවම කර ගැනීමට රජයට ගත හැකි ක්‍රියා මාර්ග කවරේ ද? (ලකුණු 04) (v) මෑත කාලීන දත්තවලට අනුව ශ්‍රී ලංකාවේ තරුණ ජනගහනය තුළ විරැකියා අනුපාතිකය සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. මෙම තත්ත්වයට බලපා ඇති හේතු කවරේ ද? (ලකුණු 04)

09

(i) ආර්ථික සංවර්ධනය යනු මිනිස් ජීවිතයේ ආර්ථික තත්ත්වය හා ගුණාත්මක තත්ත්වය ඉහළ නංවන ආර්ථික ව්‍යුහයේ වෙනස්කම් ඇතිකරන පරිණාමන ක්‍රියාවලියකි.
ආර්ථික වෘද්ධිය යනු කිසියම් රටක නිෂ්පාදන ධාරිතාවේ නැතහොත් මූර්ත නිමැවුමේ අඛණ්ඩ ඉහළ යාමකි.
රටක් ආර්ථික සංවර්ධනය ලඟා කර ගැනීමේදී ආර්ථික වෘද්ධියට අමතරව පහත සඳහන් දෑ කෙරෙහිද අවධානය යොමු කළ යුතු වේ.

- ආදායම් ව්‍යාප්ති විෂමතා අවම වීම.
- සැමට සමාන ඉඩ ප්‍රස්ථා විවෘත වීම.
- පෞද්ගලික නිදහස ශක්තිමත් වීම.
- යහපත් සෞඛ්‍යය හා පෝෂණ මට්ටමක්
- දරිද්‍රතාවය පහළ යාම.
- පාරිසරික ගුණාත්මකභාවය ඉහළ නැංවීම

රටක් ආර්ථික වෘද්ධිය කරා ගමන් කිරීමේදී අවධානය යොමු කරන්නේ මූර්ත නිමැවුම වැඩි කර ගැනීම කෙරෙහිය.එහෙත් රටක් සංවර්ධනය කරා ගමන් කිරීමේදී නිමැවුමට අමතරව සෞඛ්‍ය, අධ්‍යාපනය, පරිසරය, දේශපාලන හා සමාජ පරිසරය වැනි අංශයන් කෙරෙහි ද අවධානය යොමු කරයි.
එමනිසා රටක් සංවර්ධනය කරා ගමන් කිරීමේදී ආර්ථික වර්ධනය අත්‍යවශ්‍ය සාධකයක් වුවද එය ප්‍රමාණවත් නොවේ.

(ii) තිරසර සංවර්ධන අභිමතාර්ථ ඉටුකර ගැනීමට යාමේදී රටවල් මුහුණ දෙන අභියෝග

- කාලගුණික හා දේශගුණික විපර්යාස (නියඟ,ගංවතුර,ගෝලීය උණුසුම් වීම)
- යුධමය ගැටුම්,ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් ,වර්ගවාදය ජාතිවාදය වැනි ගැටුම්කාරී තත්ත්වයන්
- නිලධාරිවාදය සහ රජයේ මැදිහත්වීම අවම වීම.
- ප්‍රාග්ධන හිඟය
- නොදියුණු තාක්ෂණය
- ඉහළ විදේශ ණය සහ ආර්ථික අර්බුධ හේතුවෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල යටිතල පහසුකම් සංවර්ධනයට සහ සුබසාධක කටයුතු සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීමට ඇති අපහසුතාව.
- සංවර්ධනය වෙමින් පවතින රටවල බදු ආදායම් අඩුවීම, අපනයන ආදායම් පහත වැටීම සහ ඍජු විදේශ ආයෝජන සීමා වීම. (ඕනෑම කරුණු 4 කට ලකුණු 04)

(iii) නිරපේක්ෂ දරිද්‍රතාව යනු පුද්ගලයකුට හෝ කුටුම්භයකට ජීවත්වීම සඳහා අවශ්‍ය කරන අවම පෝෂණ මට්ටම හෝ මූලික අවශ්‍යතා හෝ සපුරා ගැනීමට ප්‍රමාණවත් ආදායම් මට්ටමක් නොමැති වීම (ලකුණු 01)

සාපේක්ෂ දරිද්‍රතාව යනු කිසියම් රටක ආදායම් ව්‍යාප්තියේ පවත්නා විෂමතා නිසා එක් පිරිසක් උපයන ආදායමට සාපේක්ෂව තවත් පිරිසක් උපයන ආදායම අඩු වීමයි. (ලකුණු 01)

නිරපේක්ෂ දරිද්‍රතාව මැනීමට උපයෝගී කර ගන්නා මිනුම්

- ජාතික දරිද්‍රතා රේඛාව
- ජනගහන දරිද්‍රතා දර්ශකය
- දරිද්‍රතා අන්තර් දර්ශකය
- බහුමාන දරිද්‍රතා දර්ශකය (ඕනෑම දර්ශකයන් 2කට ලකුණු 02)

(iv) ආර්ථික වර්ධනයක් සමඟ ආදායම් බෙදීයාමේ විෂමතා අවම කර ගැනීමට රජයට ගතහැකි ක්‍රියාමාර්ග

- අධ්‍යාපනයේ ගුණාත්මක බව වැඩි කිරීම.
- කෘෂි අංශයේ ඵලදායිතාව වැඩි කිරීම.
- දිළිඳු හිතකාමී ආර්ථික වර්ධනයට මුල්තැන දීම.
- සමාජ ආරක්ෂණ වැඩසටහන් කාර්යක්ෂම කිරීම සහ නිවැරදිව ඉලක්කගත කිරීම.
- තුලිත ප්‍රාදේශීය සංවර්ධනයට ප්‍රමුඛතාව දීම. (ලකුණු 04)

(v) තරුණයින් අතර විරැකියා අනුපාතිකය ඉහළ යාමට හේතු

- තරුණ තරුණයින් සතු නෘායික දැනුම පෞද්ගලික අංශයේ පවත්නා රැකියා අවශ්‍යතාවයන්ට නොගැලපීම.
- පවත්නා අධ්‍යාපන ක්‍රමය රැකියා වෙළෙඳපොළ බලාපොරොත්තු වන වෘත්තිය කුසලතා ,භාෂා දැනුම ,ඩිජිටල් සහ තාක්ෂණික කුසලතා වර්ධනය අරමුණු නොකිරීම.
- ශ්‍රම බලකායේ වර්ධනයට සාපේක්ෂව ආර්ථිකය වර්ධනය නොවීම.
- පෞද්ගලික අංශයේ රැකියා වලට වඩා රාජ්‍ය අංශයේ රැකියා අවස්ථාවන් සෙවීම.
- බොහෝ කර්මාන්ත සහ සේවා අංශයේ රැකියා බස්නාහිර පළාත තුලත් නාගරික ප්‍රදේශ වලත් කේන්ද්‍රගත වී තිබීම නිසා තරුණ පිරිසට ඒවා වෙත ප්‍රවේශ වීමට ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම.
- තරුණ කාන්තාවන් සමාජීය සම්ප්‍රදායන් ,රැකියා ස්ථානයේ ආරක්ෂාව පිළිබඳ ගැටළු සහ නම්‍යශීලි රැකියා අවස්ථා අඩුවීම නිසා විරැකියා තත්ත්වයට මුහුණ දීම. (ලකුණු 04)

10 වන ප්‍රශ්නය

10.

(i) 2015-2024 දක්වා කාලය තුල වයස අවු.14 ට අඩු ජනගහනය 24% සිට 21% දක්වා පහත වැටී ඇති බව මහ බැංකු දත්ත ඇසුරින් හෙළි වේ. මෙබඳු පහත වැටීමක් කෙරෙහි බලපා ඇති සාධක හා එමගින් ආර්ථිකය මත ඇති කරන බලපෑම පෙන්වා දෙන්න. (ලකුණු 05)

(ii) ඇමරිකානු රජය විසින් මෑත කාලයේ පනවන ලද තීරුබදු ප්‍රතිපත්තිය, ශ්‍රී ලංකාවේ ආර්ථිකය මත ඇති කළ බලපෑම් පරීක්ෂා කරන්න. (ලකුණු 05)

(iii) හුවමාරු ක්‍රියාවලියේදී භෞතික මුදල් භාවිතය වෙනුවට විද්‍යුත් මුදල් භාවිතයේ වාසි , අවාසි දක්වන්න. (ලකුණු 05)

(iv) (අ) ශ්‍රී ලංකාව සිය විදේශ වෙළෙඳ සබඳතා ශක්තිමත් කර ගැනීම සඳහා ඇති කර ගන්නා ලද ද්වි පර්ශ්වීය වෙළෙඳ ගිවිසුම් කවරේද? (ලකුණු 02)

(ආ) මෙවැනි වෙළෙඳ ගිවිසුම්වල අරමුණු පෙන්වා දෙන්න. (ලකුණු 03)

10

(i) ළමා ජනගහනය පහළ වැටීම සමාජය හා ආර්ථික කරුණු ගණනාවක ප්‍රතිඵලයකි.

- උපත් අනුපාතිකය පහළ යාම
  - නවීන පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ දැනුවත්භාවය
  - දරුවන් සංඛ්‍යාව සීමා කිරීමට පෙළඹීම ආදී තත්ත්වයන් මත
- විවාහ වන වයස ප්‍රමාද වීම
  - තරුණ තරුණියන් උසස් අධ්‍යාපනයට සහ ස්ථාවර වෘත්තියක් ගොඩනගා ගැනීමට ප්‍රමුඛතාව දීම නිසා විවාහ වන වයස ප්‍රමාද වී ඇත.
  - ප්‍රමාද වී විවාහ වීම නිසා කාන්තාවන්ගේ සරු කාලයේ සීමා වන අතර, උපත් සංඛ්‍යාව අඩුවීමට ද සෘජුවම බලපායි.
- ආර්ථික අර්බුදය සහ ජීවන වියදම
  - දරුවන් පෝෂණය, සෞඛ්‍ය සහ අධ්‍යාපනය සඳහා වැය වන විශාල පිරිවැය දරා ගත නොහැකි වීම නිසා බොහෝ අය දරු උපත් පමා කිරීම හෝ සීමා කිරීම සිදුකරයි.
- ශ්‍රම සංක්‍රමණය
  - ප්‍රජනන වයස් කාණ්ඩයේ පසුවන තරුණ තරුණියන් රැකියා සහ ස්ථිර පදිංචිය සඳහා විදේශගත වීම මෙරට උපත් සංඛ්‍යාව තවදුරටත් අඩුවීමට හේතු වී ඇත.
- කාන්තා අධ්‍යාපනය හා ශ්‍රම බලකායට එක්වීම.
  - කාන්තාවන් උසස් අධ්‍යාපනයට යොමු වීම හා රැකියා ක්ෂේත්‍රයට යොමු වීමත් සමග තම වෘත්තීය ගමන සහ දරුවන් රැක බලා ගැනීමේ ගැටුමකට මුහුණ දීමට වීම නිසා දරු උපත් සංඛ්‍යාව අඩුවීම සිදුවේ.

(ඕනෑම කරුණු දෙකකට ලකුණු 02)

ශ්‍රී ලංකාව මේ වන විට ජනගහණ විපර්යාසයේ අවසාන අදියරේ පසුවන අතර, මෙහිදී උපත් අනුපාතය සහ මරණ අනුපාතය යන දෙකම අඩු මට්ටමක පවතී.

මෙහි ප්‍රතිඵලයක් ලෙස ළමා ජනගහණය අඩුවන අතර ම, වැඩිහිටි ජනගහණය වේගයෙන් ඉහළ යමින් පවතී. මෙය දිගු කාලීනව රටේ ආර්ථිකයට ප්‍රබල බලපෑම් එල්ල කරයි. එබඳු බලපෑම් අතර,

- ශ්‍රම බලකාය හීන වීම
  - ළමා ජනගහණය අඩුවීම නිසා අනාගතයේ දී ශ්‍රම බලකාය අඩුවේ. එය රටේ නිෂ්පාදනය අඩු වීමට හා ශ්‍රම පිරිවැය ඉහළ යාමට හේතු වෙයි.
- යැපුම් අනුපාතය ඉහළ යාම
  - වැඩ කරන වයසේ ජනගහණය අඩුවන අතර ඔවුන් මත යැපෙන වැඩිහිටි ජනගහණය ඉහළ යාම නිසා එක් පුද්ගලයකුට නඩත්තු කිරීමට වන පුද්ගලයින් ගණන ඉහළ යාමෙන් පුද්ගල ඉතුරුම් අඩු වීම හා ආයෝජන මට්ටමක් පහළ යාම සිදුවේ.
- රජයේ වියදම් කළමනාකරණය පිළිබඳ ගැටලු.
  - ජනගහණ ව්‍යුහය වෙනස් වන විට රජයේ අයවැය ප්‍රමුඛතා වෙනස් කිරීමට සිදුවේ. සෞඛ්‍ය වියදම් ඉහළ යාම, විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ක්‍රමවේද සඳහා වැය වන මුදල් ඉහළ යාම නිසා රජය මූල්‍ය හිඟය ඉහළ යෑමට හේතුවේ.
- වෙළඳපොළ ඉල්ලුම වෙනස් වීම
  - ළමා ජනගහණය අඩුවීම නිසා ළදරු හා ළමා නිෂ්පාදන ඉල්ලුම අඩුවීම, පාසල් හා රෝහල් ඉල්ලුම අඩුවීම මගින් විරැකියා ඇතිවීම.
  - නවෝත්පාදන හා තාක්ෂණික වර්ධනය අඩාල වීම
    සාමාන්‍යයෙන් තරුණ පරපුර නව තාක්ෂණය සහ නවෝත්පාදනයට යොමුවන අතර තරුණ ජනගහණය සීමා වීම රටේ නවෝත්පාදන වේගය අඩපණ කිරීමට හේතු වේ.
    මෙම තත්ත්වයන්ට මුහුණ දීම සඳහා ශ්‍රමණ ඵලදායිතාව ඉහල නැංවීම, ස්වයංක්‍රීයකරණය සඳහා යොමු වීම, වැනි ක්‍රම අනුගමනය කරන අතරම, විශ්‍රාම යන වයස් සංශෝධනය වැනි පියවර ගැනීමට සිදුවේ.

(ඕනෑම කරුණු තුනකට ලකුණු 03)

(ii) ඇමරිකාව යනු ශ්‍රී ලංකාවේ විශාලතම තනි අපනයන වෙළෙඳපොළ වන බැවින් මෙහි බලපෑම තීරණාත්මක ය. එලෙස බලපාන ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් පහත දැක්වේ.

- ඇඟලුම් ක්ෂේත්‍රයේ තීරු බදු නිසා ඇඟළුම් නිෂ්පාදන පිරිවැය ඉහළ යයි. සැපයුම් මිල ඉහළ යාම නිසා ඇමරිකාවට යවන ඇඟළුම් මිල ඉහළ යයි.
- එසේම තරගකාරීත්වය අහිමි වේ. බංග්ලාදේශය වියට්නාමය වැනි රටවලට සාපේක්ෂව මෙරට බඩු මිල අධික වීම නිසා ඇමරිකානු ගැනුම්කරුවන් වෙනත් රටවල් වෙත යොමුවිය හැක.
- GSP+ සහනය පිළිබඳ අවිනිශ්චිතතාව
  GSP+ යටතේ ලබා දුන් බදු සහන ප්‍රතිපත්ති වෙනස් වුවහොත් මීට පෙර බදු රහිතව අපනයනය කළ භාණ්ඩ බදු සහිත ව ඉහළ මිලකට විකුණයි. එය අපනයන ආදායමේ පහළ යාමට, ලාභාංශ පහළ යාමට හේතුවේ.
- විදේශ විනිමය ආදායම පහළ යාම
  අපනයන අඩුවීම හරහා රටවලට ගලා යන විදේශ විනිමය ප්‍රමාණය අඩුවේ.
- විදේශ ආයෝජන කෙරෙහි බලපෑම
  විශේෂයෙන් ඇමෙරිකානු වෙළෙඳපොළ ඉලක්ක කර ගත් දෙස් විදෙස් ආයෝජනයන් පහළ යා හැක.

ඇමෙරිකානු චීන වෙළඳ ගැටුම් නිසා ලංකාවට වක්‍රාකාරයේ වාසි සහගත තත්ත්වයක් ඇතිවිය හැක.

(ඕනෑම කරුණු හතරකට ලකුණු 04)

(iii)

- ගනුදෙනු පිරිවැය හා කාලය ඉතිරිවීම
  භෞතික මුදල් ගණන් කිරීම, මාරු කාසි සෙවීම, බැංකු ශාඛාව වෙත යාම ආදිය නිසා විශාල වශයෙන් කාලය ගතවන නමුත් online banking , QR වැනි විද්‍යුත් ක්‍රම භාවිතයේ දී ක්ෂණික ව සිදුවේ.
- මුදල් නෝට්ටු මුද්‍රණය, ප්‍රවාහනය, ආරක්ෂාව ආදියට රජයට සහ බැංකුවලට වැයවන විශාල පිරිවැය පහළ යාම.
  ආරක්ෂාව හා විනිවිද භාවය, සොරකම් අවම වීම, විශාල මුදල් ප්‍රමාණයක් ළඟ තබා ගැනීමේ අවධානම පහව යන අතර ගනුදෙනුවේ සෑම පියවරක් ම ඩිජිටල් ලෙස සටහන් වේ.
  වංචාව වැළක්වීම , කළු සල්ලි සංසරණය හෝ ව්‍යාජ නෝට්ටු භාවිතය අවම කිරීමට විද්‍යුත් මුදල් පද්ධතිවල ඇති පරීක්ෂණ මංපෙත් උදව් වේ.
- මූල්‍ය අන්තර් කරණය
  ඕනෑම තැනක සිට ඕනෑම වෙලාවක ගෙවීම් කළ හැකි වීම. මෙය සාර්ව ආර්ථිකයේ මුදලේ සංසරණ ප්‍රවේගය වැඩි කිරීමට හේතු වෙයි.
- නිරවද්‍යතාවය සහ පහසුව
  අන්තර්ජාතික වෙළඳාමේ දී විනිමය අනුපාත ගණනය කිරීම සහ මුදල් හුවමාරුව නිවැරදි ව හා කාර්යක්ෂම ව කළ හැක.
  විද්‍යුත් මුදල් භාවිතය කාර්යක්ෂමතාවයට බාධා පමුණුවන අවස්ථා ද හඳුනාගත හැක.
- විද්‍යුත් මුදල්වල කාර්යක්ෂමතාව උපරිම වීමට නම් පහත බාධක ජයගත යුතුය.
  ඩිජිටල් සාක්ෂිසරතාව
  තාක්ෂණික බිඳ වැටීම්
  ආරක්ෂාව (විශේෂයෙන් හැකර්වරුන්ගෙන්) (ලකුණු 02)

(iv)

අ) ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම (2024 .02.03)
ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (2013 වසරේ සිට යළි ක්‍රියාත්මක වීම)
ශ්‍රී ලංකා - චීන නිදහස් වෙළඳ ගිවිසුම (සාකච්ඡා මට්ටමේ)

(ඕනෑම කරුණු දෙකකට ලකුණු 02)

ආ)

ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමේ අරමුණු (SLTFTA)

- භාණ්ඩ වෙළඳාම , සේවා වෙළඳාම, ආයෝජන සහ බුද්ධිමය දේපොළ අයිතිවාසිකම් ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක සහයෝගීතාව වර්ධනය

ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA)

- සිංගප්පූරුව හරහා ලෝක මට්ටමේ ආයෝජන ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම

ශ්‍රී ලංකා - චීන නිදහස් වෙළඳ ගිවිසුම (SLCFTA)

- දෙරට අතර වෙළඳ අසමතුලිතතාව අවම කර ගැනීම, ලාංකීය තේ, මැණික් ,වෙනත් නිෂ්පාදන සඳහා චීන වෙළඳපොලේ වැඩි ඉඩක් ලබා ගැනීම. (ඕනෑම ගිවිසුමක අරමුණු දැක්වීමට ලකුණු 03)

****